# ශ්‍රී ලංකාවේ
# ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීම සඳහා
# ප්‍රතිපත්තිමය නිර්දේශ

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයින්
සමඟ සිදු කළ සාකච්ඡා මාලාවක් මත පදනම්ව සකස් කරන ලදි.

25 YEARS 1996 - 2021 CENTRE FOR POLICY ALTERNATIVES

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

# ශ්‍රී ලංකාවේ ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීම සඳහා ප්‍රතිපත්තිමය නිර්දේශ

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයින්

සමඟ සිදු කළ සාකච්ඡා මාලාවක් මත පදනම්ව සකස් කරන ලදි.


විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

2021 මැයි

**ශ්‍රී ලංකාවේ ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීම සඳහා**
**ප්‍රතිපත්තිමය නිර්දේශ**

ප්‍රථම මුද්‍රණය : **සැප්තැම්බර් 2021**

ISBN : 978-624-5914-06-7

සංස්කරණය : **ලයනල් ගුරුගේ**

පරිගණක සැකැස්ම : **වාක්‍යා රූ**

ප්‍රකාශනය **: විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන, දේශපාලන පක්ෂවාදිත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටුවනු ලැබුයේ මහජන ප්‍රතිපත්ති පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්ති විවේචනාත්මක විමර්ශනයට භාජනය කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැප වී සිටී.

| | | |
|---|---|---|
| ලිපිනය | : | 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 05. |
| දුරකථන | : | 011 2370803 / 4 |
| ෆැක්ස් | : | 011 2370801 / 2 |
| වෙබ් අඩවිය | : | www.cpalanka.org |
| ඊමේල් | : | info@cpalanka.org |
| ෆේස්බුක් | : | www.facebook.com/cpasl |
| ට්විටර් | : | @cpasl |

# පටුන


සාකච්ඡා පත්‍රය පිළිබඳව පූර්විකාවක් 5

පෙරවදන 7

සාකච්ඡා පත්‍රය පිළිබඳව ලුහුඬු සමාලෝචනයක් 8

සාකච්ඡා පත්‍රය පිළිබඳව පූර්විකාවක්
ශ්‍රී ලංකාවේ ප්‍රචණ්ඩ අන්තවාදය ආමන්ත්‍රණය සඳහා
ඵලදායී සමාජ ප්‍රතිපත්ති දිශානතියක් වෙත 9

සාකච්ඡා පත්‍රය පිළිබඳව විශේෂ සටහන 13

සාකච්ඡා පත්‍රය පිළිබඳව හැඳින්වීම 15

1. විධායක සාරාංශය 17

1.1 ප්‍රචණ්ඩ අන්තවාදය වෙත පෙළඹවීමේ සහ ආකර්ෂණය කර ගැනීමේ සාධක 17

1.2 ප්‍රධාන නිර්දේශයන්හි සාරාංශය 20

2. හැඳින්වීම 24

3. සාකච්ඡා මාලාව පැවැත්වීමේ අරමුණු 27

4. භාවිත කළ ක්‍රමවේදය 29

5. මූලික ගැටලු, නෛතික තත්ත්වයන් සහ නිර්දේශ 33

6. නිගමනය 47

# පෙරවදන

විශේෂයෙන්ම තරුණයන් අතර වූ ප්‍රචණ්ඩ අන්තවාදය ලෝකය පුරා දිගින් දිගටම පවතී. ඒ හා සමගම සබැඳිව ගමන් කරන්නේ මරණය හා විනාශය ගෙනදෙමින් සමාජයන්හි සමාජ - දේශපාලනික, සංස්කෘතික සහ ආර්ථික නිර්මිතය විනාශ කිරීමේ ශක්‍යතාවයි. ශ්‍රී ලංකාවේ තත්ත්වය මීට අගන්තුග වූවක් නොවේ. අඩුම වශයෙන් 1970 ගණන්වල සිට රටේ උතුරේ සහ දකුණේ ප්‍රචණ්ඩ කැලඹීම් පැවතුණු අතර එමගින් ශ්‍රී ලංකාවේ ජනතාව අතර සාමය සහ සංහිඳියාව සඳහා වූ හදිසි අවශ්‍යතාව ඉස්මතු කොට දක්වනු ලැබිණි.

මේ සියල්ලෙහිදී කැපීපෙනෙන සේ ඉස්මතුවන එක් ලක්ෂණයක් නම් තමන්ට සවන්දෙනු ලැබීමට, තමන් බරපතළ ලෙස සැලකිල්ලට ගනු ලැබීමට හා මහජන ප්‍රතිපත්ති සම්පාදන කතිකාවතෙහි ප්‍රධාන පංගු පාර්ශ්වකරුවකු ලෙස සහභාගී කරගනු ලැබීමට තරුණයන්ට අවශ්‍යව තිබියදී එසේ සිදු නොවීම තුළ පැනනගින ඉච්චාභංගත්වයයි. අපගේ දේශයෙහි තරුණයන්ගේ පිටස්තරභාවය හා මුල් සිඳුණුබව පිළිබඳව බියෙන් හා පක්ෂපාතීත්වයෙන් තොරව කටයුතු කළ යුතු වන අතර එසේ සිදු නොවුවහොත් අපට දිගින් දිගටම තමන් සමග සාමයක් නොමැති රටක වාසය කිරීමට සිදු වනු ඇත.

මෙම ගැටලුව සම්බන්ධයෙන් වන එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි (මබාච) අවධානය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සාදරයෙන් පිළිගනු ලබයි. එමෙන්ම අප තරුණ තරුණියන් වෙතින් ලබාගන්නා ලද අදහස් සහ මතවාදයන් නොසලකා හරිනු නොලැබෙතැයි හා ඉවත නොදැමෙනු ඇතැයි අපි උදක්ම බලාපොරොත්තු වෙමු. එමතුද නොව, ඒවාට ලැබිය යුතු බරපතළ සැලකිල්ල ලබා දී අප සැම දැඩි ලෙස බලාපොරොත්තු වන සහ ලැබීමට සුදුසු වන සාමය, සෞභාග්‍යය සහ සංහිඳියාව උදා කර ගැනීමේ ප්‍රධාන සංඝටකයන් බවට ඒවා පත් කර ගත යුතු බව ද අපගේ හෘදයාංගම බලාපොරොත්තුවයි.

**අචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු**
විධායක අධ්‍යක්ෂ,
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

# සාකච්ඡා පත්‍රය පිළිබඳව ලුහුඬු සමාලෝචනයක්

ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීම වූ කලී එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය, මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සහ වෙනත් ජාත්‍යන්තර මානව හිමිකම් සම්මුතීන් හි දක්වා ඇති මූලධර්ම හා සාරධර්ම යටතේ කරනු ලැබිය යුතු කැපවීමක් හා බැඳීමක් වේ. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කල, ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීම සඳහා වන ක්‍රියාමාර්ග ඵලදායී හා තිරසාර වීමට නම් හුදෙක් ප්‍රතිපත්ති, නීති සහ උපායමාර්ග පමණක් නොව ඒවා නිසි පරිදි උපරිම අන්දමින් ක්‍රියාත්මක කිරීම හා ඊට අදාළ ප්‍රායෝගික නිර්දේශයන් සැකසීම අවශ්‍ය වේ. ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීම සඳහා වන ප්‍රායෝගික නිර්දේශයන් සැකසීම සඳහා ප්‍රමුඛතාව දිය යුතු අතර එය රටේ බහුත්ව හා විවිධත්වයෙන් යුත් සමාජමය ලක්ෂණයන් මත ස්ථිරව පදනම් විය යුතුය.

ශ්‍රී ලංකාවේ මේ වන විට සාමය, සංහිඳියාව සහ ප්‍රචණ්ඩ අන්තයන් වැළැක්වීම සඳහා ප්‍රතිපත්ති හා වැඩසටහන් රාශියක් පවතින අතර මෙරට සිදු වූ විවිධාකාරයෙහි ප්‍රචණ්ඩ අන්තවාදී තත්ත්වයන් සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස අතීතයේ දී කොමිෂන් සභා ගණනාවක් පත් කරන ලදි. එහෙත්, පටු දේශපාලන අවශ්‍යතා, එම ප්‍රතිපත්ති වැඩසටහන්වල සුසංයෝගය නොමැතිකම සහ ඒවායින් සමහරක් පවතින සමාජ යථාර්ථයන් ආමන්ත්‍රණය කිරීමට අපොහොසත් වීම ඇතුළු විවිධ හේතු නිසා පූර්ණ ලෙස ක්‍රියාත්මක නොවේ. වර්තමානයෙහි විද්‍යමාන වන ආකාරයට, සමස්තයක් වශයෙන් රට මෙන්ම එහි මුඛ්‍ය ශක්තියක් වන් බහුත්ව ස්වභාවය ද විනාශය කරා යොමු කෙරෙන ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීම සඳහා ක්‍රියාත්මක කළ හැකි ප්‍රායෝගික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග කිහිපයක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව මෙයින් සනාථ වේ.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සකස් කරන ලද ප්‍රතිපත්ති නිර්දේශයන් අන්තර්ගත මෙම ලේඛනය, ප්‍රතිපත්ති, ආයතන සහ නෛතික ප්‍රතිසංස්කරණ හරහා ප්‍රචණ්ඩ අන්තවාදයට එරෙහිව සටන් කිරීම සඳහා නැඹුරු වූ ක්‍රියාමාර්ග උදෙසා මගපෙන්වීමක් ලබා දෙන අතර එය පශ්චාත් යුදමය පසුබිමක අතිශයින්ම වැදගත්ය. ප්‍රතිපත්ති අඛණ්ඩවම හුදු ප්‍රතිපත්ති වශයෙන් පමණක් පවතින්නේ නම්, එම ප්‍රතිපත්තිවල අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට අපට නොහැකි වනු ඇති අතර, එබැවින් ක්‍රියාත්මක කිරීමට යෝජිත ප්‍රතිපත්තිවලින් අර්ථවත් බලපෑමක් ඇති කිරීම සඳහා එය තීරණාත්මක සාධකයක් වනු ඇත. මේ අනුව ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක නොකිරීම සහ ප්‍රතිපත්ති අසාර්ථක වීම ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති කතිකාවෙහි නිසගයෙන්ම පිළිබිඹු වන සාධකයක්ව පවතිනු ඇත.

**ආචාර්ය රාමසාමි රමේෂ්**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
දේශපාලන විද්‍යා අංශය,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

# සාකච්ඡා පත්‍රය පිළිබඳව පූර්විකාවක්

# ශ්‍රී ලංකාවේ ප්‍රචණ්ඩ අන්තවාදය ආමන්ත්‍රණය සඳහා ඵලදායී සමාජ ප්‍රතිපත්ති දිශානතියක් වෙත

### ප්‍රචණ්ඩ අන්තවාදය යනු කුමක් ද?

ප්‍රචණ්ඩ අන්තවාදය යන්න 9/11 සිදුවීමේ පසුවිපාකවලින් පසුව විශ්ලේෂකයින් සහ සංවර්ධන නියෝජ්‍යායතන අතර ගෝලීය වශයෙන් ජනප්‍රියත්වයට පත්වූ පාරිභාෂික යෙදුමකි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, එක්සත් ජනපදයේ, මූලික වශයෙන් ආරක්ෂක ඉදිරි දැක්මකින් දැනුවත් වූ 'ත්‍රස්තයට එරෙහි යුද්ධය', ප්‍රශ්නයේ නිදන්ගත හේතුවලට ප්‍රතිචාර දැක්වීමේ දී අසාර්ථක බව ඔප්පු වීම යි. ත්‍රස්තවාදයට එරෙහි වීමේ සහ සුරක්ෂිතකරණයේ ක්‍රියාමාර්ග මගින් පමණක් ප්‍රචණ්ඩ අන්තවාදයේ විශාල ප්‍රශ්නයට ආමන්ත්‍රණය කළ නොහැකි බව වැඩි වැඩියෙන් තේරුම් යන්නට විය. ත්‍රස්තවාදය සහ ප්‍රචණ්ඩ අන්තවාදය ඇතැම් විට සාහිත්‍යයේ දී එකිනෙකක් වෙනුවට යොදා ගනු ලැබුව ද, 'ප්‍රචණ්ඩ අන්තවාදය' යන්න විශ්ලේෂණාත්මකව වඩාත් උචිත සහ දේශපාලනික වශයෙන් වඩාත් නිවැරදි බවට පත් වූයේ එමගින් ප්‍රචණ්ඩත්වය සඳහා තිබිය හැකි දිරිගැන්වීම් හඳුනා ගැනීමට හැකි වීමත්, ප්‍රචණ්ඩ අන්තවාදයේ යටින් පවතින හේතු තුරන් කිරීමට සැලසුම් කළ මැදිහත් වීම් ඉල්ලා සිටීමත් නිසා ය. මේ වනවිට එය ආගමික දේශපාලන හෝ වෙනත් ඕනෑ ම ආකාරයක හෝ විය හැකි, එක් ආකාරයක හෝ වෙනත් ආකාරයක හෝ අන්තවාදයක් සමග සම්බන්ධ, සෑම වර්ගයක ම ප්‍රචණ්ඩත්වය ආවරණය වන පරිදි පුළුල් අර්ථයකින් යොදා ගත්ත ද, ඉස්ලාම් අන්තවාදය විසින් අවුළුවනු ලබන ප්‍රචණ්ඩත්වය සමග ප්‍රචණ්ඩ අන්තවාදය යන යෙදුමට වංශාවලිමය (ජානමය) සම්බන්ධයක් ඇත.

සමාජ විද්‍යාවේ වෙනත් බොහෝ යෙදුම්වලට මෙන් ම, ප්‍රචණ්ඩ අන්තවාදය යන්නට ද, විශ්වීය වශයෙන් පිළිගත් නිර්වචනයක් නැත. ඇත්තෙන් ම, වඩාත් පුළුල් ලෙස යොදා ගන්නා නිර්වචනය වන්නේ USAID මගින් යෝජනා කළ නිර්වචනය යි. එයින් ප්‍රචණ්ඩ අන්තවාදය නිර්වචනය කරනු ලබන්නේ "සමාජ, ආර්ථික හෝ දේශපාලන අරමුණු ඉදිරියට ගෙනයෑම සඳහා, ප්‍රචණ්ඩත්වය සඳහා උද්දේශනය, එහි යෙදීම, සූදානම් වීම හෝ එසේ නැත්නම් මතවාදී වශයෙන් දිරිගැන්වීමට හෝ සාධාරණීකරණය කිරීමට හෝ ආධාර කිරීම" වශයෙනි. (USAID, 2011). වෙනත් ආකාරයකින් කිවහොත් මෙය, ප්‍රචණ්ඩත්වයේ ප්‍රධාන චරිතවල දැක්ම ඉදිරියේ ප්‍රචණ්ඩත්වය සාධාරණීකරණය කිරීමකි. එසේ වන්නේ ප්‍රධාන චරිතවල ඇතැම් සමාජ, ආර්ථික සහ දේශපාලන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා තිබෙන එක ම මාර්ගය ලෙස ප්‍රචණ්ඩත්වය සාධාරණීකරණය කරන දැඩි මතධාරී මතවාදයකින් එය අවුළුවන හෙයිනි. අන්තවාදය ලෙස ඇතැම් අයට පෙනී යන දේ, අනෙක් අයට ද අන්තවාදය ලෙස අවශ්‍යයෙන් ම පෙනී යා නොහැකි හෙයින්, අන්තවාදය නිරූපණය කරන්නේ කෙසේ ද? යන්න ද ප්‍රශ්න මතු කරන්නකි. මෙම සන්දර්භය තුළ ප්‍රචණ්ඩ අන්තවාදයේ තිබිය යුතු ගුණාංග දෙකක් හඳුනාගෙන ඇත. පළමුවැන්න, තමන්ගේ ම කණ්ඩායමේ උත්තරීතරභාවය උත්කර්ෂයට නැගීම සහ එයට ඇති අභියෝග සමග කටයුතු කිරීම යි. දෙවැන්න, විවිධත්වයට සහ සියලු දෙනා ඇතුළත් කරගත් සමාජයක් පිළිබඳ සංකල්පයට විරුද්ධ වීම යි. ප්‍රචණ්ඩ අන්තවාදයේ මෙම අත්‍යවශ්‍ය ගුණාංග මගින්, විවිධත්වය පිළිගැනීම සහ විශ්වීය මානව හිමිකම් වැනි ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මවලින් එහි කැඩී යෑමේ ආතතිය ඇති කරයි.

ඇතැම් විචාරකයින් පෙන්වා දී ඇත්තේ සෑම අන්තවාදයක් ම අත්‍යවශ්‍ය වශයෙන් ප්‍රචණ්ඩත්වය ඇති නොකරන බව සහ සෑම ප්‍රචණ්ඩත්වයක් ම අන්තවාදය සමග සම්බන්ධ නැති බව යි. කෙසේ වෙතත්, Schmid (2014) පෙන්වා දුන් කරුණ වන්නේ, ඉස්ලාම් සමාජවල ප්‍රජාතන්ත්‍රවාදය වර්ධනය කිරීමේ කෝණයෙන් බලන විට ප්‍රචණ්ඩ නොවන ඉස්ලාම් අන්තවාදය සමග සම්බන්ධ වීම, ප්‍රචණ්ඩ ඉස්ලාම් ආන්තවාදය සමග සම්බන්ධ වීම තරම් ම නරක බව යි. අනෙක් අතට මත්ද්‍රව්‍ය, ත්‍රස්තවාදය වැනි සංවිධානාත්මක අපරාධ සමග සම්බන්ධ ප්‍රචණ්ඩත්වය සාමාන්‍යයෙන් එබඳු කිසිදු අන්තවාදී මතවාදයකින් අවුළුවනු ලබන්නක් නොවේ. වැදගත් වන්නේ, අප ප්‍රචණ්ඩ අන්තවාදය යන යෙදුම භාවිත කරන විට, තමන්ගේ මතවාදය හෝ විශ්වාසය හෝ වෙනුවෙන් තමන්ගේ ජීවිත කැප කිරීමට බොහෝ විට සූදානම්ව සිටින, කැපවීමෙන් යුතු දැඩි මතවාදී පිරිසක් ගොඩ නගන්නා වූත්, එකක් අනිකෙන් සාධාරණීකරණය කරන්නා වූත්, ප්‍රචණ්ඩත්වයක් සහ අන්තවාදී මතවාදයක් පිළිබඳ අර්ථ දැක්වීම අප තේරුම් ගන්නා බවයි.

ප්‍රචණ්ඩ අන්තවාදය යන සංකල්පය ගැන නොයෙකුත් වෙනස් මත ඇතත්, මෙම ප්‍රචණ්ඩත්වය තිරසාර ආකාරයකට පාලනය කිරීමට ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය අසමත් වූ තත්ත්වයක් තුළ, වැඩි වැඩියෙන් අන්තර්සම්බන්ධ වෙමින් පවතින ලෝකයේ විවිධ ආකාරයෙන් අන්තවාදී ප්‍රචණ්ඩත්වය දිගට ම පැවතීම නිසා එම සංකල්පය තහවුරු වී ඇත.

## ප්‍රචණ්ඩ අන්තවාදය පිළිබඳ ශ්‍රී ලංකාවේ ඉතිහාසය

මෙම යෙදුමේ සමකාලීන භාවිතයට පෙර සිට ශ්‍රී ලංකාව ප්‍රචණ්ඩ අන්තවාදයේ අත්දැකීම් ලැබී ය. පශ්චාත් නිදහස් ශ්‍රී ලංකාවේ සංවිධානාත්මක ප්‍රචණ්ඩ අන්තවාදයේ ප්‍රථම සිදුවීම වන්නේ 1971 දී ජනතා විමුක්ති පෙරමුණේ නැගිටීම යි. බහුතර සිංහල ප්‍රජාවේ තරුණ කැරලිකාර කණ්ඩායමක රාජ්‍ය විරෝධී ප්‍රචණ්ඩත්වය, මාක්ස්වාදය, යටත් විජිත වාදය, පන්ති අරගලය සහ ජාතියට ඇති ආදරය (දේශප්‍රේමය) සහ එවැනි දේ පිළිබඳ විශේෂිත තෙරුම් ගැනීමකින් යුතුව ඔවුන්ගේ දැක්මට අනුව සාධාරණීකරණය කළ මෙය පසුගිය කොටසින් අර්ථ දැක්වූ ආකාරයට පැහැදිලිව ම ප්‍රචණ්ඩ අන්තවාදයේ අවස්ථාවකි. එවකට බලයේ සිටි වාම සම්භවයක් සහිත රාජ්‍යය විසින් මෙම ව්‍යාපාරය නිර්දය ලෙස මර්දනය කරන ලද්දේ මෙම නැගිටීමට හේතු වූයේ කුමක් ද? මෙවැනි දෑ අනාගතයේ සිදුවීම වැළැක්වීම කුමක් කළ හැකි ද? යන්න තේරුම් ගැනීම සම්බන්ධයෙන් කිසිදු ආකාරයේ බරපතළ අවධානයකින් තොරව ය. එහි ප්‍රතිඵල ලෙස දශක දෙකක් යන විට දේශපාලන සහ සමාජ පැවැත්මට විශාල ප්‍රමාණයේ විනාශයක් සිදු කරමින් පළමු කැරැල්ලට සමාන මතවාදී සම්භවයකින් යුතු අතෘප්තිමත් සිංහල තරුණ කණ්ඩායමක දෙවැනි ජවිපෙ නැගිටීම 1987 සිට ආරම්භ වී ය. රජයට එරෙහිව දේශප්‍රේමී ප්‍රචණ්ඩත්වයකට ආයාචනය සඳහා කැරලිකරුවන් යොදාගත් අතිරේක නව කරුණ වූයේ ඉන්දීය සාම සාධක හමුදා ශ්‍රී ලංකාවේ රැඳී සිටීම යි. මේ අවස්ථාවේ දක්ෂිණාංශික සම්භවයක් සහිත පාලක පක්ෂය විසින් මෙහෙයවන ලද රාජ්‍යයේ ජවිපෙ මර්දනය බොහෝ අවස්ථාවල වඩාත් ප්‍රචණ්ඩ සහ කුරිරු වී ය. මේ අවස්ථාවේ දී, ජාතික තරුණ කොමිසම පත් කිරීම සහ සමහර ප්‍රතිපත්ති නිර්දේශ ක්‍රියාත්මක කිරීම මගින් තරුණ කැරැල්ලට නිදන්ගත හේතු හඳුනා ගැනීමට රජය ආරම්භ කළ ඇතැම් උත්සාහයන් වී ය. කෙසේ වෙතත්, ජාතික තරුණ කොමිසම විසින් උද්දේශනය කරන ලද ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළේ කොටස් වශයෙන් වන අතර එය සිදු වූයේ නිතිපතා පසු විපරමකින් තොරව සහ වෙනස් වන තත්ත්වයන් පිළිබඳව බරපතළ සමාලෝචනයකින් තොරව ය.

1980 ගණන්වල සිට ක්‍රියාත්මක වූ එල්ටීටීඊ නැගිටීමට සම්බන්ධ වූයේ ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර ප්‍රදේශවල දෙමළ තරුණ පිරිස් ය. 'දෙමළ ඊළම' යන අදහස වටා කේන්ද්‍රගත ජාතික විමුක්තිය පිළිබඳ මතවාදයක් තුළ, දෙමළ තරුණයින් පුහුණු කිරීම, සන්නද්ධ කිරීම සහ මෙහෙයවීම යන තේරුමෙන් එය ප්‍රචණ්ඩ අන්තවාදයක් වී ය. ආක්‍රමණික හමුදාවක් ලෙස සහ සියලු සුළුතරයන් බැහැර කරන සිංහල බෞද්ධ මතවාදයෙන් සකස් වූ ආධිපත්‍යධාරී ව්‍යුහයක් ලෙස හඳුනාගත් ශ්‍රී ලංකා රජයට එරෙහි ප්‍රචණ්ඩත්වය සාධාරණීකරණය කළේ ජීවිත පූජාව පිළිබඳ ප්‍රබල මතවාදයකිනි. අනෙක් අතට, සන්නද්ධ දෙමළ කණ්ඩායම් විසින් විවිධ රැලි වශයෙන් ක්‍රියාත්මක කළ ජනවාර්ගික කණ්ඩායම් ඉවත්

කිරීම් මගින් මුස්ලිමුන් සහ සිංහලයින් පලවා හැරීමෙන් පෙන්නුම් කළ පරිදි දෙමළ රාජ්‍යය සම්බන්ධයෙන් එල්ටීටීඊයට තමන්ගේ ම ආධිපත්‍යවාදී අදහසක් තිබිණි. එල්ටීටීඊයට එරෙහි රාජ්‍ය මර්දනයේ දී, දකුණේ ජවිපෙ නැගිටීම් දෙකක් මැඩලීමෙන් උගත් පාඩම් භාවිත කළ ද, එල්ටීටීඊ ය සමග සටන් වැදීම සඳහා සෙබළුන් බඳවා ගැනීමට, ඔවුන් පුහුණු කිරීමට සහ එල්ටීටීඊය සමග සටන් වැදීමට ඔවුන් මෙහෙයවීම සඳහා සිංහල ජාතියේ අඛණ්ඩතාවය ආරක්ෂා කිරීමේ සිංහල බෞද්ධ මතවාදය යොදා ගනිමින් යුද්ධයේ කුරිරු අවසන් අදියරේ දී ඔවුන් තුරන් කිරීමට ක්‍රියා කළේ, ශ්‍රී ලංකා රජය එය සාධාරණීකරණය කළ ද, නිදහස් චින්තකයින්, එල්ටීටීඊ හිතවාදීන් සහ ජාත්‍යන්තර ප්‍රජාවේ බොහෝ අංශ විසින් දැඩි ලෙස හෙළා දකින තත්ත්වයක ය. දිගුකාලීන ප්‍රතිචාරයක් ලෙස, රජය විසින් අත් අඩංගුවට ගෙන සිටි එල්ටීටීඊ සටන්කරුවන් පුනරුත්ථාපනය කිරීමේ වැඩ සටහනක් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට රජය ක්‍රියා කළ ද, බොහෝ නිරීක්ෂකයින් සහ එල්එල්ආර්සී (උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව) වැනි රජය විසින් පත් කරනු ලැබූ නිල පරීක්ෂණ කොමිසන් සභා මගින් යෝජනා කළ ආකාරය අනුව පශ්චාත් යුද ශ්‍රී ලංකාවේ සංහිඳියාව සහ සාමය ගොඩනැගීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමට කිසිදු බරපතළ උත්සාහයක් දරනු නොලැබී ය. මෙම සන්දර්භය තුළ, ප්‍රචණ්ඩ අන්තවාදය යන සංකල්පය මගින් රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් විසින් රජයට එරෙහිව කෙරෙන සංවිධානාත්මක සහ මතවාදයකින් මෙහෙයවන ප්‍රචණ්ඩත්වය පමණක් සලකා බැලෙන අතර ආධිපත්‍යධාරී සහ බැහැර කිරීමේ මතවාදය සහ එයට සම්බන්ධ ජාතික ආරක්ෂක රාමුවක් යොදා ගනිමින් උතුරේ සහ දකුණේ කැරලිකරුවන් ඉලක්ක කරගත්, රජය ක්‍රියාත්මක කරන ප්‍රචණ්ඩත්වය බැහැර කිරීම නිසා, ඒ තාක් දුරට එය දෝෂ සහිත විය හැකි ය. කෙසේ වෙතත්, පවතින යම් වාතාවරණයක් තුළ රජය එම ප්‍රචණ්ඩත්වය යොදා ගන්නේ කෙසේ ද? කාට එරෙහිව ද? යන්න නොතකා රජයට ප්‍රචණ්ඩත්වයේ ඒකාධිකාරය ඇතැයි යන අදහසින් මෙයට විරුද්ධ විය හැකි ය.

ඉහත ඡේදයේ සමාලෝචනය කළ රාජ්‍ය විරෝධී නැගිටීම් තුනෙහි පොදු ලක්ෂණ කිහිපයක් ඇත.

**පළමුවැන්න -** මෙම තුන ම, පවතින අධ්‍යාපන ක්‍රමය, රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ රැකියා සඳහා බඳවා ගැනීමේ ප්‍රතිපත්ති, ආණ්ඩුකරණ ක්‍රමය සහ සමාජයේ සහ දේශපාලනයේ ඇති අසාධාරණ භාවිතයන් නිසා තමන් සඳහා අනාගතයක් දකින්නට නොලැබුණු, පූර්ණ සහ අර්ධ රැකියා නියුක්ත හෝ රැකියා විරහිත තරුණයන් විසින් මෙහෙයවන ලද තරුණ කැරලි වීම යි. තිබෙන විද්වත් අධ්‍යයනයන්, ආණ්ඩුවෙන් ක්‍රියාත්මක කළ පරීක්ෂණ මෙන් ම, මෙම ප්‍රතිපත්තිය ලේඛනයට පදනම් වූ අංගයක් ලෙස ක්‍රියාත්මක කළ විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයින් සමග උපදේශන සාකච්ඡා මාලාව මගින් ද මෙය ප්‍රධාන කාරණයක් ලෙස මතු වී තිබේ.

**දෙවැන්න -** කැපවීමෙන් යුතු තරුණ ජනයා හඳුනා ගැනීමට සහ බඳවා ගැනීමට කැරලිකාර කණ්ඩායම් විවිධ වූ උපාය මාර්ග යොදා ගනු ලැබී ය. එයට සමාජ, පන්තිය, ජනවර්ගය, කුලය, ස්ත්‍රී පුරුෂ බව වින්දිතභාවයේ ඉතිහාසය ඇතුළත් වී ය. ව්‍යුහාත්මක කොන්කිරීම්වල වින්දිතයින් හඳුනා ගැනීමට ජවිපෙ සහ එල්ටීටීඊ යන සංවිධාන දෙක ම මෙම නිර්ණායක, උපාය මාර්ගිකව යොදා ගත් අතර ඇතුළත් කර ගැනීමේ ස්වභාවයේ යැයි පෙනී යන, විමුක්ති මතවාදයක් වර්ධනය කළේ ය. ජවිපෙ නැගිටීම් දෙකෙහි සහ එල්ටීටීඊ නැගිටීමේ සාමාජිකයන්ගේ වයස් සහ ස්ත්‍රී පුරුෂ බෙදීම් පිළිබඳව දත්ත නොමැති වුව ද, මෙම ව්‍යාපාරවල මූලික කොට්ඨාසය වූයේ 15 සිට 35 දක්වා වයස් කාණ්ඩය සහ අවිවාහක ජනයා බව පෙනෙන්නට තිබේ. මෙම සංවිධාන හැම එකක් ම විසින්, තරුණ කාන්තාවන් ද බඳවා ගනු ලැබූ අතර ඔවුන්ගේ සංඛ්‍යාව සහ ක්‍රියාකාරී සහභාගීත්වය එකෙනෙකට පසුව ආ සෑම කැරලි ව්‍යාපාරයක දී ම වර්ධනය වී ය.

**තෙවැන්න -** බඳවා ගනු ලැබූවන් ඔවුන්ගේ පවුල්වලින් සහ විශාල සමාජයේ සමානයන්ගේ කණ්ඩායම්වලින් වෙන් කරනු ලැබූ අතර සංවිධානයෙන් පිටත කුමන හෝ සමාජ වටිනාකම්, අදහස් සහ කිසිදු නිදහස් දැක්මකට විවෘත නොවූ පූර්ණකාලීන හමුදාවක කොටසක් ලෙස සංවිධානය කරනු ලැබී ය. එර්වින්ග් ගොෆ්මාන් (Erving Goffman) එම යෙදුම යොදාගත් අර්ථයෙන් මෙම සංවිධාන සමස්ත ආයතන (Total Institutions) වූ අතර ඒවා, පවුලේ, ආගමික සංවිධාන,

අධ්‍යාපනික ආයතන, සහ තරුණ සමාජ, ක්‍රීඩා ක්‍රියාකාරකම්, සහ සංස්කෘතික වැඩ කටයුතු සහ එබඳු සංවිධානවලින් ද බලපෑමට ලක් වීමෙන් වළක්වා තිබිණි. පවුල්වලින් සහ සාමාන්‍ය සමානයන්ගේ කණ්ඩායම්වලින් වෙන් කිරීම මගින් කැරලිකාර සංවිධානවලට තමන්ගේ සාමාජිකයින් අතර ඒකාකාරී චින්තනයක් වර්ධනය කර ගැනීමට හැකියාව ලැබුණු අතර තමන් කොටස් කරුවන් වන, නිවැරදි කළ නොහැකි බව පෙනී යන ක්‍රමයෙන් මිදීමට ඇති එක ම මාර්ගය ලෙස පෙනෙන ප්‍රචණ්ඩ අන්තවාදී ක්‍රියාමාර්ගයට ඔවුන්ව සම්පූර්ණයෙන් ඇතුළත් කර ගැනීමට හැකියාව ලැබෙයි.

**සිව්වැන්න -** මෙම ව්‍යාපාරවලට ප්‍රතිචාර දැක්වීමේ දී, ඔවුන් (රජය) යොදාගත් ප්‍රමුඛතම උපායමාර්ග වූයේ කැරලි මැඩලීම, සන්නද්ධ මර්දනය සහ නීති ක්‍රියාත්මක කිරීම යි. මෙම උපායමාර්ගය කෙටි කාලීන වශයෙන් සාර්ථක විය හැකි වුව ද, මෙම රැඩිකල් ව්‍යාපාර තුන එකකින් පසුව එකක් ලෙස පැමිණීමෙන් ලබා දෙන ප්‍රබල ඇඟවීම වන්නේ මර්දනය පැහැදිලිව ම, ප්‍රචණ්ඩ අන්තවාදයට දිගුකාලීන වශයෙන් සාර්ථක පිළියමක් නොවන බව යි. මෙයින් අපව රැගෙන යන්නේ ශ්‍රී ලංකාවේ තරුණ ජන කොට්ඨාසය අතර ප්‍රචණ්ඩ අන්තවාදය තුරන් කිරීම සඳහා ක්‍රියාත්මක කළ යුතු සමාජ ප්‍රතිපත්ති පිළිබඳ සමස්ත ප්‍රශ්නයටය.

මෙම ලේඛනයෙන් ඉදිරිපත් කරන ලද්දේ, තරුණයින්ගේ අවශ්‍යතා විසඳීම සඳහා සාමාන්‍ය ප්‍රතිපත්ති දර්ශනයකි. අදාළ ප්‍රතිපත්ති ක්ෂේත්‍රයට අධ්‍යාපනය, රැකියා, තරුණ කටයුතු, ආණ්ඩුකරණය, සංස්කෘතික කටයුතු සහ සාමය සහ සංහිඳියාව ද ඇතුළත් ය. තරුණයින් අතර ප්‍රචණ්ඩ අන්තවාදය සඳහා ඇති විය හැකි ප්‍රවණතා වැළැක්වීම සඳහා මෙම ක්ෂේත්‍රවල විවිධ මැදිහත්වීම් අවශ්‍ය විය හැකි ය. ප්‍රචණ්ඩ අන්තවාදය තුරන් කිරීම සඳහා එක් ප්‍රතිපත්තියකට එරෙහිව අනෙකක් හඳුනා ගැනීමට හෝ උද්දේශනයට හෝ අවශ්‍ය වන සියලු දත්ත අද වන විට අප සතුව නැත. කෙසේ වුවත්, රටේ දැන් පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ඩිජිටල් මාධ්‍ය උපයෝගී කරගෙන රටේ එක් තරුණ කණ්ඩායමක් සමග කළ උපදේශනයක්, ප්‍රචණ්ඩ තරුණ අන්තවාදයේ තවත් අවස්ථාවක් නැවත ඇති වීම වැළැක්වීමට, විස්තීර්ණ ආකාරයෙන් පිළියම් යෙදීම සඳහා තරුණ අවශ්‍යතා හඳුනා ගැනීමට ප්‍රමාණවත් නොවිය හැකි ය. කෙසේ වෙතත්, තරුණයන්ගේ ප්‍රචණ්ඩ අන්තවාදයක් වැළැක්වීමට සාක්ෂි පදනම් වූ උපාය මාර්ගයක් සංවර්ධනය වෙතට ප්‍රයෝජනවත් ආරම්භයක් සිදු කොට ඇති අතර, තරුණයින් ද ඇතුළුව සැලකිලිමත් සියලු පාර්ශ්වකරුවන් අතර සංවාදයක් ආරම්භ කිරීමට ශක්තිමත් වේදිකාවක් බවට මෙය පත්වනු ඇතැයි බලාපොරොත්තු තැබිය හැකි ය.

**කාලිංග ටියුඩර් සිල්වා**
සම්මාන මහාචාර්ය (සමාජ විද්‍යා),
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

# සාකච්ඡා පත්‍රය පිළිබඳව විශේෂ සටහන

මෙය ප්‍රචණ්ඩ අන්තවාදය පිළිබඳ වත්මන් තත්ත්වය මෙන්ම, ප්‍රචණ්ඩ අන්තවාදයෙහි විනාශකාරී ප්‍රතිවිපාකයන් දුරලීම සඳහා අවැසි ප්‍රතිපත්තිමය නිර්දේශයන් කවරේද යන්න සම්බන්ධයෙන් වන වාර්තාවකි. තවද මෙරට තරුණ ප්‍රජාවෙහි එක් තීරණාත්මක පැතිකඩක් නියෝජනය කරනු ලබන්නා වූ විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් සමඟ සිදු කළා වූ පළුල් වූත් විවෘත වූත් සංවාදයක ප්‍රතිඵලයක් වශයෙන් මෙම වාර්තාව හඳුන්වා දිය හැකිය.

ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේ විශ්වවිද්‍යාල දෙකක තරුණ තරුණියන් සමඟ මෙම සංවාද මාලාව පැවැත්වීමට මූලික වශයෙන් සැලසුම් කරන ලදි. කෙසේ නමුත්, මෙම සාකච්ඡා මාලාව හුදෙක් ඊට අදාළ විෂය කාරණයෙහි ඇති ජාතික වැදගත්කම හේතුවෙන්ම, විශ්වවිද්‍යාල දහයක විද්‍යාර්ථීන්ගේ විශ්ලේෂණ, විවේචන මෙන්ම සාධනීය යෝජනා සහ නිර්දේශයන් ද සහිතව පැවැත්වීමට හැකි වීම පිළිබඳව අපි සතුටු වන්නෙමු. එකී සංවාදයෙහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රචණ්ඩ අන්තවාදය දුරලීමේ දිගු ජාතික සංවාදයක මූලාරම්භය සනිටුහන් කිරීමට මෙම උත්සහය හේතු වනු ඇති බවට අප උදක්ම විශ්වාශ කරන්නෙමු.

මෙරට විශ්වවිද්‍යාල ප්‍රජාව හා ප්‍රචණ්ඩ අන්තවාදය වැනි සංකීර්ණ විෂයක් පිළිබඳව ඔවුන්ගේ පුළුල් දැක්ම සම්බන්ධයෙන් අවිවාදයෙන්ම අපට සතුටු විය හැකිය. ඒ මන්ද යත්, මෙරට සමාජ, ආර්ථික, දේශපාලනික මෙන්ම සංස්කෘතිකමය වශයෙන් වූ ක්ෂේත්‍රයන්හි සාකල්‍ය ප්‍රවේශයකින් යුත් ප්‍රගමණයක් අපේක්ෂා කරමින් මෙරටට අවැසි ප්‍රතිපත්ති නිර්මාණය කිරීමේ ජන වරම ලැබූ බොහෝ ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් හඳුනා නොගත් තීරණාත්මක ප්‍රතිපත්තිමය ස්ථාවරයන් ගණනාවක් මොවුන් විසින් ඉස්මතු කිරීමයි.

මොවුන් භෞමික වශයෙන් ශ්‍රී ලංකාවේ විවිධ දිශාවන්හි සිටියේ වුවද, ස්වකීය ප්‍රතිපත්තිමය යෝජනාවන් පෙන්වා දීමේ දී සමස්තයක් වශයෙන් ශ්‍රී ලාංකික යන අනන්‍යතාවයෙන් ජාතිකමය දෘෂ්ටිකෝණයකින් ප්‍රශ්න දෙස බැලීමම අතිශය වැදගත්ය.

එනිසා, මෙම වාර්තාවෙහි අඩංගු අදහස් හා යෝජනාවන් දෙස යථාර්ථවාදීව බලන ලෙසට ප්‍රතිපත්ති සම්පාදකයින්ගෙන්, තීරණ ගන්නා නිලධාරීන්ගෙන් මෙන්ම විද්වතුන්ගෙන් අපි ඉල්ලා සිටිමු. මෙරට තරුණ ප්‍රජාව තීරණ ගන්නා මට්ටම්හි කාර්යයන් වෙනුවෙන් සක්‍රියව දායක කරගන්නා ලෙසටද අප ඔවුන්ට ආරාධනය කරමු.

මෙම කර්තව්‍යය සිදු කිරීමේ දී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි නියෝජිතයන් දැක්වූ නම්‍යශීලීත්වය බෙහෙවින්ම අගය කරන අතර ඔවුන්ගේ දායකත්වය හා අදහස් දැක්වීම් සම්බන්ධයෙන් අපගේ කෘතඥතාවය පළ කරනු කැමැත්තෙමු. මෙම අධ්‍යයනය සිදු කිරීමේ දී අදහස් ලබා දෙමින් සහයෝගය දැක්වූ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂ අචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු මේ සඳහා පූර්විකාවක් ඉදිරිපත් කළ මහාචාර්ය ටියුඩර් සිල්වා සහ වාර්තාවට සමාලෝචන සටහනක් එක් කළ ආචාර්ය රාමසාමි රමේෂ් යන විද්වතුන් මෙහි දී කෘතඥතා පූර්වකව සිහිපත්

කරමු. විශේෂයෙන්ම මෙම කාර්ය සිදු කිරීමේ දී ඊට නන් අයුරින් දායකත්වය සැපයූ සහ උපකාර කළ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සියලු සගයන්ටද ස්තුති කරන්නෙමු.

එමෙන්ම මෙම සාකච්ඡා මාලාව පැවැත්වීමේ දී ඒ ඒ විශ්වවිද්‍යාලයන්හි අචාර්යවරුන් විසින් දැක්වූ අදහස් හා සහයෝගය මෙහි අන්තර්ගතය වඩාත් ඵලදායී කිරීමට හේතු වූ බවත් ඔවුන් සියලු දෙනාට මෙන්ම මෙහි ජීව ගුණය වූ සියලුම විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ටද මෙරට සමස්ත තරුණ ප්‍රජාව වෙනුවෙන් අපගේ කෘතඥතාව පිරිනමනු කැමැත්තෙමු.

සම්මුතියක් නොමැති වීම හේතුවෙන් උද්ගත වූ ප්‍රශ්න, පශ්චාත් යුධ වාතාවරණයක සම්මුතියකින් විසඳා ගැනීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයන්, අදාළ පාර්ලිමේන්තු කාරක සභා සාමාජිකයන් හා අනෙකුත් පාර්ශ්වකරුවන් මෙම වාර්තාව මඟින් ඉස්මතු කරන කරුණු හුදු වාර්තාවකට සීමා නොකොට ක්‍රියාවන් බවට පත් කිරීමට කටයුතු කරනු ඇතැයි අපි තරයේ විශ්වාස කරමු.

**ලයනල් ගැරුගේ**
ජ්‍යෙෂ්ඨ පර්යේෂක,
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය.

# සාකච්ඡා පත්‍රය පිළිබඳව හැඳින්වීම

ප්‍රචණ්ඩ අන්තවාදයන් වැළැක්වීම අරමුණු කර ගනිමින් ගෝලීය වශයෙන් විවිධාකාරයේ ක්‍රියාමාර්ගයන් ගෙන ඇති නමුදු, ප්‍රචණ්ඩ අන්තවාදය වූ කලී ලොව පුරා බරපතළ අවධානයට ලක්ව ඇති තත්වයක් වන අතර, ඒ හේතුවෙන් සත්‍ය වශයෙන්ම සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික ආදී වශයෙන් වූ ක්ෂේත්‍රවලට අහිතකර බලපෑම් බොහොමයක් උද්ගත කර තිබේ. කෙසේ වුවද, ප්‍රචණ්ඩ අන්තවාදය පිළිබඳ ගැටලුවෙහි සමස්ත ප්‍රතිවිපාකයන් මෙන්ම ඊට පදනම් හේතු ආමන්ත්‍රණය කිරීම සඳහා පවතින අවශ්‍යතාවයෙහි ප්‍රමාණයට සාපේක්ෂව අවධානය යොමු නොකළ ගැටලුවක් වී තිබේ. එබැවින්, මෙම තත්ත්වය සම්බන්ධයෙන් සමාජ කතිකාවක් ගොඩනැගීම සහ පුළුල් පරාසයක අදහස් නිදහසේ ප්‍රකාශ කිරීම සඳහා ප්‍රමාණවත් හා සුදුසු ඉඩ ප්‍රස්තාවක් නිර්මාණය කිරීම ද ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීම සඳහා වන සමස්ත විසඳුමක අනිවාර්ය අංගයක් වන හෙයින්, මෙම සාකච්ඡා පත්‍රය මඟින් ද ප්‍රචණ්ඩ අන්තවාදය සහ එය වැළැක්වීමේ දී ගතහැකි පියවරයන් සම්බන්ධයෙන් පවතින ගතිකත්වයන් පිළිබඳ පුළුල් සාකච්ඡාවක් සඳහා එවැනි ඉඩක් සඳහා පසුබිම සකසා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

කෙසේ වෙතත්, ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීම සම්බන්ධයෙන් මේ වන තෙක් නිසි පරිදි භාවිතයට ගෙන නොමැති තරුණයින් සතු විභව හැකියාව සහ බහු වාර්ගික, ආගමික හා සංස්කෘතික රටක් වන ශ්‍රී ලංකාවේ "විවිධත්වයට" ඇති ගෞරවය ප්‍රවර්ධනය කිරීම උදෙසා ඒ පිළිබඳව ඔවුන්ගේ ඉදිරි දර්ශනය අවබෝධ කර ගැනීමෙන් පසු; ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීම සඳහා මෙරටේ තරුණ සහයෝගීතාවයේ විවිධ දෘෂ්ටිකෝණයන් සහ නිර්දේශයන් අවබෝධ කරගැනීම උදෙසා මෙම සාකච්ඡා මාලාව පවත්වන ලදි. ඒ අනුව, මෙම සාකච්ඡා පත්‍රයෙහි අන්තර්ගතය පදනම් වී ඇත්තේ "ශ්‍රී ලංකාවේ ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීම සඳහා විසඳුම් සොයා ගනු ලබන්නේ කෙසේද" යන මාතෘකාව යටතේ ශ්‍රී ලංකාවෙහි ජාතික මට්ටමේ විශ්වවිද්‍යාල 10ක උපාධි අපේක්ෂකයින් සමඟ පවත්වන ලද සාකච්ඡා මාලාවකින් ජනිත වූ අදහස් මත ය. මෙහි දී, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය[1] විසින් අදාළ විශ්වවිද්‍යාලයන්හි ආචාර්යවරුන් සමඟ එක්ව මෙම සාකච්ඡා මාලාව සඳහා පහසුකාරීත්වය ලබාදෙන ලද අතර උතුරු, දකුණු, නැගෙනහිර, බටහිර සහ මධ්‍යම ආදී වශයෙන් වූ පළාත් සියල්ල ආවරණය වන පරිදි තෝරාගත්තා වූ විශ්වවිද්‍යාලවල උපාධි අපේක්ෂකයින්ට තම අදහස් ප්‍රකාශ කිරීමට හැකි නිදහස් ඉඩ ප්‍රස්ථාවක් නිර්මාණය කරන ලදි.[2]

එබැවින්, මෙය "ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීම" සම්බන්ධයෙන් වන සවිස්තරාත්මක සහ පරිපූර්ණ විශ්ලේෂණයක් නොව, ප්‍රචණ්ඩ අන්තවාදය යන මාතෘකාව යටතේ මෙරට තරුණ පරම්පරාවේ කොටසක් වශයෙන් සැලකෙන විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයින්ගේ අදහස්වල පිළිබිඹුවක් වන අතර එය ශ්‍රී ලංකාවේ ප්‍රචණ්ඩ අන්තවාදයට එරෙහිව පියවර ගැනීම සම්බන්ධයෙන් වර්තමානයෙහි පවතින සමාජ කතිකාවත සඳහා දායකත්වයක් දක්වන තොරතුරු ඇතුළත් ලිපියක් වනු ඇති බවට අපේක්ෂා කෙරේ.

1 https://www.cpalanka.org/
2 කොළඹ, නැගෙනහිර, යාපනය, ශ්‍රී ජයවර්ධනපුර, කැලණිය, පේරාදෙණිය, රුහුණ, රජරට, සබරගමුව සහ අග්නිදිග යන විශ්වවිද්‍යාලයන්හි උපාධි අපේක්ෂකයන්.

# 1. විධායක සාරාංශය

ප්‍රචණ්ඩ අන්තවාදයට හේතු පාදක වන්නා වූ පෙළඹවීමේ (Push Factors) හා ඒ සඳහා ආකර්ෂණය කරගනු ලබන්නා වූ සාධක (Pull Factors) සම්බන්ධයෙන් පවතින මූලික ප්‍රවණතා පිළිබඳව සාරාංශයක් සහ ප්‍රචණ්ඩ අන්තවාදයේ මූල හේතු විධිමත්ව සහ අර්ථාන්විතව ආමන්ත්‍රණය කිරීම සහ ප්‍රචණ්ඩ අන්තවාද වැළැක්වීම සඳහා ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන් නියෝජනය කරමින් විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයින් විසින් යෝජනා කරන ලද ක්‍රියාමාර්ග සහ නිර්දේශයන් මෙම කොටස මඟින් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

## 1.1 ප්‍රචණ්ඩ අන්තවාදය වෙත පෙළඹවීමේ සහ ආකර්ෂණය කර ගැනීමේ සාධක

ප්‍රචණ්ඩ අන්තවාදය සඳහා පෙළඹවීමේ ප්‍රධාන සාධක අතර; අසමානතාව, වෙනස් කොට සැලකීම, බැහැර කිරීම නැතහොත් කොන් කිරීම, පීඩා කිරීම, සිවිල්, දේශපාලන, ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කිරීම හෝ ගෞරවාන්විතව ජීවත්වීමේ අයිතියේ නිදහස අහිමි කරනු ලැබේ යැයි ප්‍රජාවන් අතර කාලාන්තරයක් පුරාවට පවතින මතවාදය ආදී කරුණු ඒ සම්බන්ධයෙන් ඉතා තීරණාත්මක වේ. ඉහත කරුණු වලට අමතරව, විරැකියාව, දුර්වල රාජ්‍ය පාලනය, දූෂණය, ප්‍රශ්නකිරීම් වෙත නතු කෙරෙන රාජ්‍යය සහ පාලනය මෙන්ම ජනවාර්ගික - ආගමික කේන්ද්‍රීය දේශපාලනය යන සියල්ල ශ්‍රී ලංකාවේ ප්‍රචණ්ඩ අන්තවාද උද්ගත කිරීමට බලපානු ලබන සාධක ලෙස පවතී.

ශ්‍රී ලංකාවේ ද, ප්‍රචණ්ඩ අන්තවාදය සහ එහි අහිතකර ප්‍රතිවිපාකයන් හි ස්වභාවය දශක ගණනාවක් තිස්සේ විවිධ ස්වරූපවලින් දැකගත හැකි වූ අතර මෑත අතීතයේ සමාජ-දේශපාලන සන්දර්භය මගින් ද ඒ සඳහා සාක්ෂි සහිත යථාර්ථයන් පෙන්නුම් කර ඇත. ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීම සඳහා විසඳුම් සොයා ගැනීමේ අවශ්‍යතාව එමඟින් නැවත නැවතත් අවධාරණය කරනු ලබයි. ප්‍රචණ්ඩ අන්තවාදය සම්බන්ධයෙන් පවතින පර්යේෂණ සහ විශ්ලේෂණ මඟින් පෙන්නුම් කරනු ලබන්නේ ප්‍රචණ්ඩ අන්තවාදයට තල්ලු කිරීමේ සහ ඒ සඳහා ආකර්ෂණය කරගැනීමේ යනාදී වශයෙන් වන සාධක ද්විත්වය සමඟම රටේ තරුණ ප්‍රජාවෙහි විශාල සම්බන්ධතාවක් ඇති බවයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඕනෑම ආකාරයක ප්‍රචණ්ඩ අන්තවාදයක් හේතුවෙන් විශේෂයෙන්ම තරුණ ප්‍රජාව එක් අතකින් 'වින්දිතයන්' වන්නා සේම අනෙක් අතට 'වැරදිකරුවන්' වන අතර, පොදුවේ එමඟින් සමස්ත සමාජයම ප්‍රතිවිපාකයන්ට ගොදුරු වේ.

ප්‍රචණ්ඩ අන්තවාදය සඳහා පුද්ගලයන් ආකර්ෂණය කර ගැනීමේ සාධක සම්බන්ධයෙන් මෙම සාක්ච්ඡා මාලාව ඔස්සේ අදහස් බොහොමයක් ඉස්මතු වූ අතර, වෙනස්කොට සැලකීම් සහ ආන්තිකකරණයන් නැතහොත් සමාජයෙන් කොන් කිරීම් වෙනුවෙන් පෙනී සිටීම සහතික කිරීමේ හැඟීමක් ජනිත කිරීම, විවිධාකාර ගැටලු සම්බන්ධයෙන් සාධාරණ සවන්දීමක් සඳහා අවස්ථාවන් සලසා දීම, අසාධාරණයන්ට මුහුණ දුන් ජනතාවට සහන සැලසීමේ බලාපොරොත්තුවක් ඇති කිරීම, ආරක්ෂාව හා රැකවරණය සම්බන්ධයෙන් තහවුරු කිරීමේ අදහසක් ස්ථාපිත කිරීම, සම්පත් වෙන් කිරීමේ විෂමතාව හේතුවෙන් ආර්ථික වශයෙන් අසරණව සිටින පුද්ගලයින්ට සහාය වීම, රාජ්‍ය සේවා පද්ධතියේ පවතින

දේශපාලනීකරණය ආදී වශයෙන් වූ කරුණු ගණනාවක් පිළිබඳ පවතින ගැටලු සම්බන්ධයෙන් අඛණ්ඩව නොසලකා හැරීමේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රජාවන් ප්‍රචණ්ඩ අන්තවාදයේ මාර්ග කරා පහසුවෙන් ආකර්ෂණය කර ගැනීමට හැකි හේතු සාධක කිහිපයක් මෙම සාකච්ඡා මාලාවෙන් අනාවරණය විය. මෙම සන්දර්භය තුළ, ප්‍රචණ්ඩ අන්තවාදයේ දෘෂ්ටිවාදයන් කෙරෙහි තරුණ ආකර්ශනය සහ එකී තත්වයන්හි ස්වභාවයම පුද්ගලයන් ප්‍රචණ්ඩ අන්තවාදීන් බවට පත්වීමට අවැසි ආකර්ෂණීය පසුබිමෙහි පැවැත්ම සඳහා පදනම වන බවට ද කරුණු ඉස්මතු විය.

මෙරටේ පවතින බහු වාර්ගික, ආගමික හා සමාජ සංස්කෘතික පසුබිම තුළ ප්‍රජාවන් අතර අන්‍යෝන්‍ය විශ්වාසය, සහ ගෞරවය නැවත ස්ථාපිත කිරීම සඳහා දේශපාලනික කැමැත්තක් හා අවැසි නිසි ක්‍රියාමාර්ගයන් ගෙන නොමැති බවට ඉස්මතු වන ප්‍රබල හඬක් ඇත. ප්‍රචණ්ඩ අන්තවාදයේ මූලයන් යළිත් ඉසමතු වීම වැළැක්වීම සඳහා ප්‍රජාවන් අතර විශ්වාසය හා අන්‍යෝන්‍ය අවබෝධය නැවත ඇති කිරීම පිණිස ආගමික නායකයින්ගේ සහ අදාළ අනෙකුත් පාර්ශ්වයන්ගේ ක්‍රමානුකූල සහයෝගීතාවයෙන් සහ සහභාගීත්වයෙන් නිසි බලධාරීන් විසින් කෙටි, මධ්‍යම හා දිගුකාලීන ක්‍රියාමාර්ග ගත යුතුය. එබැවින්, ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීම සහ බහු සංස්කෘතික සමාජයක යහපැවැත්ම සහතික කිරීම සඳහා තිරසාර විසඳුම් සෙවීමේදී, අදාළ ප්‍රතිපත්ති සම්පාදකයින් සහ පරිපාලන බලධාරීන් විසින් මෙම සාකච්ඡාවලින් මතු වන ප්‍රධාන නිර්දේශයන් ධනාත්මක දෘෂ්ටිකෝණයකින් විමසා බැලීමේ අපේක්ෂාව සහිතව මෙම ලේඛනය සකස් කරනු ලැබේ. මෙම සාකච්ඡා මාලාව සඳහා සහභාගි වූ අතිමහත් බහුතරයකගේ අදහස්හි මූලික ප්‍රවණතාවක් වන්නේ, ප්‍රචණ්ඩ අන්තවාදී ක්‍රියාවන් සිදු වූ පසුව, ඒවාට ප්‍රතිචාර දැක්වීම සම්බන්ධයෙන් නොව, හුදෙක් එකී ප්‍රචණ්ඩ අන්තවාදී තත්වයන් උද්ගත වීමේ විභවයන් වැළැක්වීම හා සම්බන්ධ ක්‍රියාමාර්ග ගැනීමේ සමාජ ශක්‍යතාව සම්බන්ධයෙනි.

# ප්‍රචණ්ඩ අන්තවාදයට සම්බන්ධ සාමාජීය සහ පුද්ගල සාධකයන්

| පොළඹවන සාධක | ආකර්ෂණය කර ගන්නා සාධක |
| --- | --- |
| අසමානතාවය | වෙනස් කොට සැලකීම් වලින් ආරක්ෂා වීමේ සහතිකය පිළිබඳ හැඟීම |
| වෙනස් කොට සැලකීම | ආන්තිකකරණයෙන් ආරක්ෂා කරවීම සඳහා සහතික වීම |
| බැහැර කිරීම | සාධාරණ සවන් දීමක් සඳහා ඇති අපේක්ෂාව සහ ආරක්ෂාවේ හැඟීම |
| සිවිල්, දේශපාලන, ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කිරීම | අසාධාරණයන් සඳහා සහන සැලසීමේ බලාපොරොත්තුව සහ සාමය උදා කිරීමේ මිරිඟුව මවාපෑම |
| දුර්වල රාජ්‍ය පාලනය සහ රාජ්‍ය අංශයෙහි ඇති දූෂණය | දුගී භාවයෙන් පෙලෙන ජනකොටස් සඳහා ආර්ථික සහයෝගය ලබා දීම සහ සම කාලීනයන්ගෙන් ඇති පෙලඹවීමේ පීඩනය |

## 1.2 ප්‍රධාන නිර්දේශයන්හි සාරාංශය

### කෙටිකාලීන නිර්දේශ

- වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය මගින් ඓතිහාසික, සංස්කෘතික විවිධත්වය ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම, සියලු ආගම් හා සංස්කෘතික වටිනාකම් සඳහා සමාන ව්‍යවස්ථාමය ආරක්ෂණයක් සහතික කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කළ යුතුය.

- වාර්ගික හා ආගමික බෙදීම හේතුවෙන් ශ්‍රී ලංකාව තුළ පොදු අනන්‍යතාවයක් නොමැති අතර, පශ්චාත් යුධ සන්දර්භය තුළ, මෙරටේ සියලුම ජන කොටස් අතර පොදු අනන්‍යතාවයක් ඇති කිරීමේ තීරණාත්මක අවශ්‍යතාවක් පවතී.

- පාසල්වල ප්‍රජා අධ්‍යාපන විෂයයන් ඉදිරියට ගෙන යෑම සඳහා ශක්තිමත් ක්‍රියාමාර්ග අවශ්‍ය වේ. පවතින ඉගැන්වීමේ ක්‍රමවේදයන්හි යම් අඩුපාඩු ඇති බව පෙනේ. එවිට අපේක්ෂිත ප්‍රතිඵල සාර්ථකව මෙතෙක් සපුරා ගැනීමට නොහැකි වී ඇත. එබැවින් මානව හිමිකම්, ප්‍රජාතන්ත්‍රවාදය, විවිධත්වය, බහුත්වවාදය සහ සාමය යනාදිය කෙරෙහි විධිමත් අවබෝධයක් ඇති සංස්කෘතියක් පෝෂණය කිරීම සඳහා වැදගත් විෂයයක් වන ප්‍රජා අධ්‍යාපනය තුළින් අර්ථවත් වෙනසක් ඇති කිරීම සඳහා එය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඵලදායී නිරීක්ෂණයන්, ඇගයීම් කිරීම් සහ පසු විපරම් කිරීම් අවශ්‍ය වේ.

- රාජ්‍ය නිලධරයන්ගේ, නීතිය බලාත්මක කිරීමේ බලධාරීන්ගේ සහ අධිකරණයේ ස්වාධීන ක්‍රියාකාරිත්වය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර රජය විසින් ගත යුතුය. ඒ අනුව බලධාරීන් විසින් ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීමේ දී සියලු මට්ටම්වල ආයතනික රාමුවල දීර්ඝකාලීන සමාජ බැහැර කිරීම සහ හිතාමතා හෝ නොදැනුවත්ව ව්‍යුහාත්මක වෙනස්කම්වලට ලක් කිරීම සම්බන්ධයෙන් සමාලෝචනය කිරීම, නැවත අර්ථ දැක්වීම සහ අවැසි විසඳුම් ලබාදීම සිදු කළ යුතුය. එහිදී, අපක්ෂපාතීත්වය, සාධාරණත්වය, නීතිය ඉදිරියෙහි සෑම තැනැත්තකුගේම සමානාත්මතාව සහ මහජන බලය ක්‍රියාත්මක කිරීමේදී වගවීම සහ මේ රටේ පුරවැසියන්ට බලපාන තීරණ ගැනීමේදී රජයේ ගුණාත්මකභාවය පිළිබඳ ප්‍රධාන මූලධර්ම රාජ්‍ය ආයතන සහ නිලධාරීන් විසින් පිළිගැනීමට සූදානම් පසුබිමක් ඇති කළ යුතුය.

- ජනතාවගේ බහු සංස්කෘතික හැඟීම්වලට බලපාන තීරණ ගැනීමට බලය පැවරී ඇති නිශ්චිත රාජ්‍ය ආයතනවල සංයුතිය කෙරෙහි බලධාරීන් දැඩි අවධානයක් යොමු කළ යුතු අතර එවැනි ආයතනවල තීරණ ගැනීමේ තනතුරු නියෝජනය කිරීමට හා දැරීමට සමාන අවස්ථා සඳහා සියලු ජනවාර්ගික සහ ආගමික පසුබිම් නියෝජනය කරනු ලබන පුද්ගලයන්ට ඇති අවකාශය පිළිබිඹු කළ යුතුය. සිවිල් සේවයේ නිලධරයන් වඩාත් නියෝජිත හා සුළුතර ප්‍රජාවන්හි නියෝජනයක් බවට පත් කිරීමේ අවශ්‍යතාවයක් ඇති අතර, රාජ්‍ය නිලධරයන් වූ කලී මේ රටේ සැබෑ ජන විකාශන සංයුතිය පිළිබිඹු කළ යුතුය. එය හුදු සංකේතාත්මක පිළිබිඹුවක් නොවිය යුතු සේම එසේ අපේක්ෂිත නියෝජනය ක්‍රියාකාරී හා ප්‍රමාණාත්මකව සැලකිය යුතු නියෝජනයක් විය යුතුය. එමඟින් රජයේ තීරණයන්හි නීත්‍යානුකූලභාවය ඉහළ නංවන්නා සේම සුළු ජාතීන්ගේ පාර්ශ්වයෙන් රජය කෙරෙහි පවතින විශ්වාසය වැඩි වීමට ද හේතු පාදක වේ.

- රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ සියලු හා බලයලත් රාජ්‍ය ආයතන අවශ්‍ය පියවර ගත යුතු අතර එකී භාෂා ප්‍රතිපත්තියෙන් අපේක්ෂා කළ පරිදි සාමය හා සමගිය සාක්ෂාත් කර ගැනීම සඳහා එය ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැපයීම හා සම්බන්ධීකරණය කිරීම බලධාරීන්ගේ වගකීම වේ.

- සමාජ මාධ්‍ය සඳහා නිසි නියාමන යාන්ත්‍රණයක් වර්තමානයේ නොමැති අතර එය ප්‍රචණ්ඩ අන්තවාදයට වැඩි මංපෙත් විවර කරයි. එබැවින් සමාජ මාධ්‍ය ඵලදායී ලෙස නියාමනය කිරීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීමේ අවශ්‍යතාවයක් පවතී.

## මධ්‍යකාලීන නිර්දේශ

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මෙරට තුළ දැනට පවත්නා කතිකාවෙහි අන්තර්ගත අංගයක් වශයෙන් ස්වාධීන "ජාතික සංහිඳියා කොමිසමක්" පිහිටුවීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කළ යුතුය. එවැනි ස්වාධීන කොමිෂන් සභාවකට සමාජ සහජීවනය, ඒකාබද්ධතාව සහ ප්‍රචණ්ඩ අන්තවාදයට අදාළ සිදුවීම් ඇතුළුව නමුත් ඒවාට පමණක් සීමා නොවී සමස්ත ප්‍රතිසන්ධාන කටයුතු සම්බන්ධ ජනතා දුක්ගැනවිලි ලබා ගැනීමට හැකි විය යුතු අතර, එවැනි කරුණු පිළිබඳව විමසා සුදුසු පරිදි පිළියම් ලබා දීමට ද බලය තිබිය යුතු යුතුය.

- ආගම්වල දෘෂ්ටිවාදාත්මක හා අධ්‍යාත්මික අර්ථයන් වැලඳගැනීමේ වැදගත්කම ඉගැන්වීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය නිශ්චිත වැඩපිළිවෙළක් දියත් කළ යුතුය. නිදසුනක් වශයෙන්, සෑම දරුවෙකුටම ආගම් සම්බන්ධ විෂයයෙන් 30%ක් වෙනත් ආගම් ඉගෙන ගැනීමට භාවිත කිරීමට හැකි වන පරිදි අවස්ථාව සැලසිය යුතුය.

- ජනවාර්ගික හා ආගමික සංස්කෘතීන් පිළිබඳ දැනුම හා අවබෝධය ගොඩනංවන පවත්නා විෂයයකට/විෂයයන්ට සුදුසු විෂයයන් හෝ ඒකාබද්ධ කිරීම් ඇතුළත් කිරීම තහවුරු කිරීම සඳහා ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන අංශයේ ප්‍රතිසංස්කරණ අවශ්‍ය වේ. මේ අනුව, පාසල් විෂය මාලාව ප්‍රතිසංස්කරණය කිරීමෙන් විවිධත්වයේ හා විසම්මුතියේ සාරධර්ම කෙරෙහි ගෞරවය ඇති වේ. වඩාත්ම වැදගත් සාධකය නම්, මෙරට අප අනුගමනය කරන විවිධ ආගම්වල මූලික අවබෝධය ලබා දීම සඳහා පාසල්වල සංසන්දනාත්මකව ආගම් පිළිබඳ ඉගැන්වීම් සිදු කිරීමේ දැඩි අවශ්‍යතාවක් පවතින අතර එමඟින් වෙනත් ආගම් සහ ඔවුන්ගේ භාවිතයන් පිළිබඳ සැක සංකා සහ වැරදි වැටහීම් තුරන් කරනු ඇත - එය මෑත වසරවල ශ්‍රී ලංකාව තුළ උද්ගත වූ ප්‍රචණ්ඩ අන්තවාදී තත්ත්වයන්හි වැදගත් සාධකයකි.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපනය සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන වෙනත් බලය ලත් ආයතන ස්වකීය දැක්ම, මෙහෙවර සහ අරමුණු නැවත සලකා බැලිය යුතු අතර 'රටේ ජාතික සමගිය හා සමාජ සහජීවනය කෙරෙහි දැඩි උනන්දුවක් දක්වන දැනුමැති කරුණ නායකයින්' රටට දායාද කිරීම ඔවුන්ගේ ආයතනික ප්‍රතිඵලයන්හි අනිවාර්ය අංගයක් වශයෙන් ප්‍රකාශිතවම අන්තර්ගත කිරීමට වග බලාගත යුතුය.

- ආගමික වශයෙන් වෙන් කරන ලද පාසල් ද ඇතුළුව ප්‍රාථමික, ද්විතීයික හා තෘතීයික අධ්‍යාපන මට්ටම්වල ශ්‍රී ලංකාවේ පාසල් සඳහා ත්‍රිභාෂා ප්‍රතිපත්තිය රටපුරා ක්‍රියාත්මක කළ යුතුය.

- ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත සහ ඒ යටතේ ඇති අනෙකුත් විධිවිධානයන් හි සමාජ-ආර්ථික හා මානසික බලපෑම සහ එහි අහිතකර ප්‍රතිවිපාකයන් ඇගයීමට අවශ්‍ය පියවර රජය විසින් ගත යුතු අතර ජාතික සංහිඳියාව සහ සහජීවනය ප්‍රවර්ධනය කිරීම සඳහා නුසුදුසු විධිවිධාන ක්‍රියාත්මක කිරීම අහෝසි කළ යුතු වේ.

- ජාතික තරුණ ප්‍රතිපත්තියේ යෝජිත හා එකඟ වූ ප්‍රතිපත්ති යෝජනාවල ක්‍රියාවලීන් හා කාර්යසාධනය සම්බන්ධයෙන් තක්සේරු කිරීම හා ඇගයීම සඳහා තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ස්වාධීන කමිටුවක් පත් කළ යුතුය. ඒ අනුව, නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් යටිතල පහසුකම් සහ නම් කරන ලද නිලධාරීන්ගේ

වගවීම ඇතුළත් අධීක්ෂණ හා ඇගයීම් යාන්ත්‍රණයක් සැලසුම් කිරීමට පියවර ගත යුතු වේ. මේ වන විට මහජන නියෝජිත ආයතනයක දේශපාලන සහභාගීත්වය සඳහා තරුණ කෝටාවක් නොමැති අතර ඒ හේතුවෙන් තරුණ තරුණියන්ගේ දේශපාලන සහභාගීත්වය ඉහළ නැංවීම සඳහා තරුණ කෝටාව සහතික කිරීමට පියවර ගත යුතුය - එමඟින් රටේ විවිධ ප්‍රදේශවල තරුණ තරුණියන් මුහුණ දෙන ගැටලු විසඳීම සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදන ස්ථරයන්හි ඔවුන්ගේ හඬ නැංවීමටත් එමඟින් ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ ක්‍රියාවලියට දායක වීමටත් හැකියාව උද්ගත වේ. මේ ආකාරයෙන් වන දේශපාලන සහභාගීත්වයට ඉඩක් නොමැතිකම සම්බන්ධයෙන් අර්ථවත් විසඳුමක් සොයාගත නොහැකි නම්, මේ වන විට තරුණ ප්‍රජාව අතර පවතින දුක්ගැනවිලි, වේදනා සහ අපේක්ෂා භංගත්වයන් අනාගතයේ දී විවිධ අගතිගාමී දිශාවන්ට යොමුවීමේ විභව හැකියාව පවතී.

- ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීම සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය සැලකිල්ලට ගනිමින් ප්‍රධාන පාර්ශ්වකරුවන් විසින් තරුණ නායකත්වයට දිරි දෙන ප්‍රවේශයක් ක්‍රියාකාරී ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී අනුගමනය කළ යුතුය. ජනවාර්ගික දුක්ගැනවිලි සහ අන්තර් ජනවාර්ගික එදිරිවාදිකම් සමනය කිරීම සඳහා ආර්ථික අවස්ථාවන්ට ප්‍රවේශ වීම සහ සම්පත් සමානව බෙදා හැරීම මූලික වේ. තිරසාර සංවර්ධනය සඳහා මධ්‍යම රජය විසින් සිය 2030 දැක්ම තුළ එවැනි ප්‍රවේශයක් අනුගමනය කළ යුතුය.

## දිගුකාලීන නිර්දේශ

- අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සමඟ එක්ව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ මන්දගාමී ප්‍රගතිය පිළිබඳ තත්ත්වය සමාලෝචනය කළ යුතු අතර අවශ්‍ය සංශෝධන සමඟ එකී ප්‍රතිපත්ති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු උපායමාර්ගික පියවරයන් ගත යුතුය.

- රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ ආයතනික රාමුව පළාත් මට්ටමේ ශාඛාවන් ස්ථාපිත කිරීමද ඇතුළුව තවදුරටත් ශක්තිමත් කොට ස්වාධීන කොමිසමක් බවට පරිවර්තනය කළ යුතුය. එවැනි ස්වාධීන කොමිෂන් සභාවකට රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අවැසි පරිදි කටයුතු නොකරන නිලධාරීන් වගවීමට ලක් කිරීම සඳහා බලාත්මක කළ හැකි බලතල සහිත පැහැදිලි ආයතනික බලරාමුවක් ස්ථාපිත කර තිබිය යුතුය. මෙකී කොමිසමෙහි සාමාජික සංයුතිය සියලුම ජනවාර්ගික ප්‍රජාවන්ගේ නියෝජනයෙන් සමන්විත විය යුතුය.

- අතීතයේ වගකීම් විරහිත මාධ්‍ය හැසිරීම්වල බලපෑම සහ ප්‍රචණ්ඩ අන්තවාදය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් බලධාරීන් විසින් ජාතික සමගිය කෙරෙහි එහි ප්‍රතිවිපාක සමාලෝචනය කිරීමට කටයුතු කළ යුතුය. තවද, ශ්‍රී ලංකාවේ පුවත්පත් මණ්ඩලයෙහි බලතල "ස්වාධීන මාධ්‍ය කොමිෂන් සභාවක්" දක්වා පුළුල් කිරීමට බලධාරීන් පියවර ගත යුතු අතර, ශ්‍රී ලංකාවේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ වගකිවයුතු මාධ්‍ය සංස්කෘතියක් සහතික කිරීම හා බලාත්මක කිරීම සඳහා බලතල එවන් ආයතනික ව්‍යුහයකට ලබා දිය යුතු වේ.


- සාමය හා සංහිඳියාව සම්බන්ධයෙන් උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව (එල්එල්ආර්සී) විසින් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම.

- තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය විසින් රට පුරා තරුණ ස්වේච්ඡා සේවය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති සකස් කළ යුතුය. එමඟින් තරුණයින්ට ඔවුන්ගේ සමාජය හා අවසානයේ රට පිළිබඳ හැඟීමක් ඇති වන අතර ඔවුන්ගේ ආකල්ප හා හැසිරීම් රටා ඵලදායී ආකාරයකින් හැඩගස්වා ගැනීමට එය උපකාරී වනු ඇත. මේ සඳහා, පශ්චාත් යුධ සන්දර්භය තුළ අනුගමනය කරන ලද තරුණ ප්‍රතිපත්ති, එනම් ශ්‍රී ලංකා තරුණ පාර්ලිමේන්තුව (SLYP) (2010), ජාතික තරුණ ප්‍රතිපත්තිය (2014) සහ යෞවනයන්ට සම්බන්ධ සමහර වැඩසටහන් සහ ආයතන පාලනය කරන

ක්‍රියාකාරකම් සමාලෝචනය කිරීමේ අවශ්‍යතාවක් පවතී. ජාතික තරුණ සමාජ නවෝත්පාදන අභියෝගය (2017) වැනි පවත්නා ව්‍යුහයන්හි ස්වේච්ඡා නම් වූ අංග ලක්ෂණය පැහැදිලිව දැකිය නොහැක.

- ශ්‍රී ලංකා සාමාජීය සන්දර්භය තුළ ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීම පිළිබඳ කටයුතු කරනු ලබන ප්‍රධාන පාර්ශ්වකරුවන් විසින් ප්‍රතිත්‍රස්තවාදය වැනි දැඩි ආරක්ෂිතමය ප්‍රවේශයකට වඩා ප්‍රචණ්ඩ අන්තවාදයේ මූලයන් හා හේතු ආමන්ත්‍රණය කිරීම සඳහා යොමු වීමේ නැම්යාවක් පෙන්නුම් කළ යුතුය.

# සාකච්ඡා මාලාවට සහභාගී වූ ප්‍රතිචාරකයන්



# 2. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රචණ්ඩ අන්තවාදය සම්බන්ධයෙන් වන තත්ත්වය දශක ගණනාවක අතීතයට දිව යයි. ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වීම, බහු වාර්ගික හා ආගමික මෙන්ම සංස්කෘතික ජන ව්‍යුහයක් පැවතීම, ජනතාව සර්වජන ඡන්දය ප්‍රකාශ කිරීමේ වරප්‍රසාදයට ඉක්මණින් හිමිකම් කී ආසියාවේ රාජ්‍යයක් වීම යන සාධක පැවතිය ද; විටින් විට ආණ්ඩු බලයට පත් වූ රජයන් විසින් බහු වාර්ගික, ආගමික හා සංස්කෘතික සමාජයක අභිලාෂයන් සහ ගැටලු විසඳීමට අපොහොසත් වීම ද ඇතුළු ගැටලු ගණනාවක් හේතුවෙන් ප්‍රචණ්ඩත්වය ඉස්මතු වූ සමාජ නැගිටීම් පිළිබිඹු කළ අවස්ථාවන් ගණනාවක් සම්බන්ධයෙන් අත්දැකීම් පවතී. ඒවායින් සමහර ප්‍රචණ්ඩකාරී තත්ත්වයන් තරුණ අරගල, අභ්‍යන්තර කැරලි සහ සිවිල් යුදමය තත්ත්වයන් දක්වා පවා වර්ධනය විය.

සමස්ත ශ්‍රී ලංකාවටම බලපාන පරිදි අහිතකර බලපෑම් උද්ගත කළ ප්‍රධාන ප්‍රචණ්ඩ අන්තවාදී සිදුවීම් අතර, රැඩිකල්කරණයේ සිට ප්‍රචණ්ඩ අන්තවාදය දක්වා විහිදුණු වර්ෂ 1971 දී දකුණේ උද්ගත වූ තරුණ නැගිටීම පැහැදිලි නිදර්ශනයක් වශයෙන් පෙන්වා දිය හැකිය. මීට අමතරව, වර්ෂ 1983 දී ඇති වූ ජනවාර්ගික කෝලාහලය පසුව එය දීර්ඝ කාලීනව දශක ගණනාවක් පුරාවට පැවති යුද්ධයකට තුඩු දුනි. 1980 දශකයේ පසුකාලීන අවධිය ද ප්‍රචණ්ඩ අන්තවාදයේ අමිහිරි මතකයන් ඉතිරි කළ කාලපරිච්ඡේදයක් පෙන්නුම් කළ අතර, එහි දී පැවති ප්‍රචණ්ඩත්වය රටේ දකුණු ප්‍රදේශයේ වැඩි තීව්‍රතාවයක් පෙන්නුම් කරන ලදි. ඊට අමතරව, වෙනත් අවස්ථාවන් ගණනාවක දී ප්‍රචණ්ඩ අන්තවාදය මතු වී ඇති අතර; ඒ සෑම තත්වයක දී ම මිනිස් ජීවිත, දේපළ, ආර්ථික ස්ථාවරත්වය, සමාජ සහජීවනය සහ රටේ සාමය ඇතුළු සාධකවලට බොහෝ අහිතකර බලපෑම් ඇති කළ අවස්ථා කිහිපයක් තිබේ.

# ආයතනික ප්‍රතිසංස්කරණ සඳහා ඇති අවශ්‍යතාවය

| යෝජිත ආයතනික යාන්ත්‍රණයන් | කාර්ය කර්තව්‍යයන් |
|---|---|
| රටේ පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ විවාදය සහ කතිකාවත හරහා ස්වාධීන "ජාතික සංහිඳියා කොමිසමක්" ස්ථාපිත කිරීම කෙරෙහි දැඩි අවධානය යොමු කළ යුතුය. | සමාජ ප්‍රතිසන්ධානය, සහජීවනය සහ ප්‍රචණ්ඩ අන්තවාදී සිදුවීම් ඇතුළුව ඒවාට පමණක් සීමා නොවී සංහිඳියාව හා බැඳි තත්ත්වයන් හා සම්බන්ධ දුක්ගැනවිලි ලබා ගැනීමටත්, ඒ පිළිබඳ සැලකිලිමත් වී ඒ සඳහා පිළියම් සැපයීමටත් අවැසි බලතල මෙයට අනිවාර්යයෙන් ඇතුළත් විය යුතුය. |
| ජාතික තරුණ ප්‍රතිපත්තිය මඟින් යෝජිත සහ එකඟ වූ ප්‍රතිපත්ති යෝජනා වල ක්‍රියාවලීන් හා ක්‍රියාකාරීත්වයන්හි ඵලදායීතාවය තක්සේරු කිරීම සහ ඇගයීම සඳහා තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය විසින් "ස්වාධීන ඇගයීම් කමිටුවක්" පත් කළ යුතුය. | ඔවුන් කමිටුවක අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් යටිතල පහසුකම් සහ ඊට අදාළව වගකීම් පවරන ලද නිලධාරීන්ගේ වගවීම ඇතුළත් අධීක්ෂණ හා ඇගයීම් යාන්ත්‍රණයක් එමඟින් සැලසුම් කළ යුතුය. |
| දැනට තිබෙන රාජ්‍ය භාෂා කොමිසම "ස්වාධීන රාජ්‍ය භාෂා කොමිසමක්" බවට පත් කිරීම. | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අනුගත නොවන නිලධාරීන් වගවීමට ලක් කිරීමට හැකියාව සහිත පැහැදිලි බලතල රාශියක් එයට තිබිය යුතුය. මෙම කොමිසම සියලුම ප්‍රජාවන්ගේ සාධාරණ නියෝජනයක් සහිත සාමාජිකයින්ගෙන් සමන්විත විය යුතුය. |
| ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයෙහි බලතල සහ කාර්ය කර්තව්‍යයන් "ස්වාධීන මාධ්‍ය කොමිෂන් සභාවක්" දක්වා පුළුල් කිරීමට අවැසි පියවර ගැනීම. | අදහස් ප්‍රකාශ කිරීමේ මූලික අයිතිවාසිකම් සහතික කිරීම සහ වගවීමක් සහිත මාධ්‍ය සංස්කෘතියක් ශ්‍රී ලංකාව තුළ ඇති කිරීම සඳහා සුදුසු කාර්ය කර්තව්‍යයන් සහ ඒවා බලාත්මක කළ හැකි බලතල එයට තිබිය යුතුය. |


# 3. සාකච්ඡා මාලාව පැවැත්වීමේ අරමුණු

- වර්තමානයේ මෙරට තුළ පවතින සමාජ සහජීවනයේ සහ ඒකාබද්ධතාවයෙහි තත්ත්වය සහ ඒ සම්බන්ධයෙන් මේ රටේ තරුණ තරුණියන්ගේ අදහස් කවරේද යන්න හඳුනා ගැනීම.
- ශ්‍රී ලංකාවේ "ප්‍රචණ්ඩ අන්තවාදය" සඳහා පාදක වී ඇති හේතු සම්බන්ධයෙන් වන මූලික ගැටලු සහ අභියෝග හඳුනා ගැනීම.
- ශ්‍රී ලංකාවේ ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීම පිළිබඳ යෝජනා හා නිර්දේශ හඳුනා ගැනීම.
- ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීමේ විභව මාධ්‍යයන් පිළිබඳ සමාජ කතිකාවක් නිර්මාණය කිරීම සහ ඒ සඳහා අවැසි ප්‍රතිසංස්කරණ හා ක්‍රියාමාර්ගවල අවශ්‍යතාව පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහ අදාළ පාර්ශ්වකරුවන්ට පෙන්වා දීම.

# පවතින ප්‍රතිපත්තිමය ස්ථාවරයන් හා අරමුණු

සහ

# ප්‍රායෝගික යථාර්ථයන්හි පරස්පරතාවය



## විස්තරය

**ජාතික තරුණ ප්‍රතිපත්තියේ** අරමුණු අංක 3.3 තුළින් අවධාරණය කෙරෙන්නේ ''රටේ ජනවාර්ගික, සංස්කෘතික, ආගමික, භාෂා හා ජීවන රටාවන්හි විවිධත්වය හඳුනාගෙන ඒවාට ගරු කරමින් තරුණයින් අතර සමාජ වගකීම පිළිබඳ හැඟීමක් හා සමාජ සමගියක් ඇති කිරීමේ අවශ්‍යතාවය ය.''

**ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය** [Office for National Unity and Reconciliation (ONUR)] පිහිටුවන ලද්දේ ''සියලු ජන කොටස් අතර අවබෝධය, සාමය සහ සමගිය ඇති කරන සංහිඳියාව සහතික කිරීම සඳහා වැඩ සටහන් සකස් කිරීම හා ඒ සම්බන්ධයෙන් පසුවිපරම් කිරීම සහ රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා'' ය.

**ජාතික තරුණ ප්‍රතිපත්තියේ** 6 වන පරිච්ඡේදය යටතේ වන මූලික උපායමාර්ගයන් සහ ප්‍රතිපත්තිමය මැදිහත්වීම් මගින් ''අධ්‍යාපන ආයතනවල විෂය බාහිර ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්තිමය මැදිහත්වීම්වල අවශ්‍යතාව එමගින් අවධාරණය කරනු ලබන අතර; විෂය බාහිර ක්‍රියාකාරකම්, ක්‍රීඩා කටයුතු සහ නිර්මාණශීලිත්වය වැඩි දියුණු කිරීමේ අවස්ථා වැනි විනෝදාත්මක අවස්ථා හඳුනාගෙන ප්‍රවර්ධනය කිරීම; විවිධ කලා හා සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා ආයතන පිහිටුවීම; සහ පාසල්වල අනිවාර්ය බාහිර ක්‍රියාකාරකම් ප්‍රාදේශීය සහ කලාප මට්ටමින් ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවය ඉස්මතු කරනු ලැබේ.''

## විශ්වවිද්‍යාල විද්‍යාර්ථයන්ගේ අදහස්

අන්තර් වාර්ගික හා ආගමික කොටස් අතර මෙන්ම අන්තර් සංස්කෘතික වශයෙන් ද ඔවුනොවුන් අතර ඵලදායී හුවමාරු හා අන්තර් ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීමේදී ශක්තිමත් හා මානව හා භෞතික සම්පත් සහිත ආයතනික සැකැස්මක් සහිත දිගු කාලීන උපාය මාර්ග නොමැතිකම ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීමේදී සැලකිය යුතු බාධාවකි.

ප්‍රජාවන් සහ පවත්නා ආයතනික රාමු අතර සැලකිය යුතු මට්ටමක පවතින විශ්වාස පිළිබඳ පරතරය හරහා ඔවුනොවුන් බැහැර කිරීමේ හැඟීම සහ ප්‍රජාවන් අතර බෙදීම් වැඩි කරයි. ජනකොටස් අතෘප්තියට පත්වීමේ පදනම් හේතු වලට අදාළ ගැටලු විසඳීම සඳහා දේශපාලනීකරණය නොවූ ආයතනික ආරක්ෂණයන් නොමැතිකම ජාතික ප්‍රතිසංධානයට හා සමගියට බාධා කරයි.

බහු වාර්ගික හා ආගමික සහයෝගීතාවයන් පුනර්ජීවනය කිරීම සඳහා තරුණ අවබෝධය, සංවර්ධනය, කලා හා ක්‍රීඩා කුසලතාවන් පිළිබඳ ඔවුන්ගේ විශ්ලේෂණයන් ඵලදායීව භාවිතා කිරීමට වැඩපිළිවෙලක් නොමැති වීම රටේ බහු සංස්කෘතික සමාජ සන්දර්භය තුළ ඇති ප්‍රධාන අභියෝගයක් වන අතර එය ප්‍රචණ්ඩ අන්තවාදය සඳහා සමාජ බලමුලු ගැන්වීම සඳහා හේතු පාදක විය හැකිය.

# 4. භාවිත කළ ක්‍රමවේදය

මෙම ලිපිය සැකසීම සඳහා ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේ විශ්වවිද්‍යාලවල තෝරාගත් උපාධි අපේක්ෂකයින් සමඟ ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීම පිළිබඳව සාකච්ඡා මාලාවක් පවත්වන ලදි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පර්යේෂකයන් කණ්ඩායමක් විසින් ඒ ඒ විශ්වවිද්‍යාලයන්හි ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන් සමඟ ඒකාබද්ධව මෙකී සාකච්ඡාවන් මෙහෙයවීම සඳහා පහසුකාරිත්වය සපයන ලදි. මෙම සාකච්ඡාවලට මාර්ගගත තාක්ෂණය ඔස්සේ සහභාගී වූවන් විවිධ වූ ජනවාර්ගික හා ආගමික කණ්ඩායම් නියෝජනය කළ අතර එහි දී සාක්ච්ඡා සඳහා සහභාගි වූවන්ගේ ස්ත්‍රී පුරුෂ නියෝජනය වඩාත් තුලිත බව සහතික කිරීම සඳහා නිසි අවධානයක් යොමු කරනු ලැබීය.

පර්යේෂණ කණ්ඩායම සාකච්ඡා කළ කරුණු ලේඛනගත කළ අතර, පසුව මෙරටේ විවිධ ජනවාර්ගික-ආගමික කණ්ඩායම් නියෝජනය කරන පුද්ගලයින්ට විවිධාකාර බලපෑම් ඇති කරන ප්‍රචණ්ඩ අන්තවාදයන් පිළිබඳව මේ රටේ පවතින සංකීර්ණ ගැටලුව සම්බන්ධයෙන් තරුණ තරුණියන් මුහුණ දෙන යථාර්ථයන් ඉදිරිපත් කිරීම සඳහා ලබාගත් ගුණාත්මක තොරතුරු විශ්ලේෂණය කරන ලදි.

පවතින රාජ්‍ය පාලන ක්‍රමය තුළ පවත්නා විධිමත් ව්‍යුහයන් පිළිබඳව ද, සමානාත්මතාව, සාධරණත්වය සහ වෙනස් කොට සැලකීම වැළැක්වීම මෙන්ම ප්‍රචණ්ඩ අන්තවාදය ආදී ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ද නිශ්චිත හෝ යම් මට්ටමක අදාළත්වයක් ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය හා වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්හි යම් යම් අදාළ කරුණු පිළිබඳව ද මෙම ලිපියෙන් සැකෙවින් සොයා බලන ලදි.

# සාකච්ඡා මාලාව ඔස්සේ හඳුනාගත් මූලික ගැටලු වර්ගීකරණය

| | මූලික ගැටලු | ගැටලු සම්බන්ධයෙන් අවධාරණය කරන ලද විශ්වවිද්‍යාල | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | කොළඹ | නැගෙනහිර | යාපනය | කැළණිය | පේරාදෙණිය | රජරට | රුහුණ | සබරගමුව | අග්නිදිග | ශ්‍රී ජ'පුර |
| 1 | විවිධ ආගම් වල පුද්ගලයන්ට සමාන ගෞරවයක් සහ ආරක්ෂාව පිළිබඳ හැඟීමක් නොමැතිකම සහ සියලු ජනකොටස් සඳහා අන්තර්කරණයෙන් යුත් පොදු ජාතික අනන්‍යතාවයක් නොමැති වීම. | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☒ | ☑ | ☑ | ☑ | ☑ |
| 2 | බහු ආගමික හා සංස්කෘතික සමාජයක සමානාත්මතාවයේ හා සාධාරණත්වයේ වටිනාකම පිළිබඳ නිසි පිළිගැනීමක් නොමැති ප්‍රතිපත්ති සහ භාවිතයන් පැවතීම සහ ක්‍රියාත්මක වීම. | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ |
| 3 | ආගමික ආයතන දේශපාලනීකරණය වීම ජනවාර්ගික හා ආගම් භේදයට තුඩු දෙයි. | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☒ | ☑ | ☑ | ☑ | ☑ |
| 4 | නීතිය ක්‍රියාත්මක කිරීම දේශපාලනීකරණය වීම හරහා නීතියේ ආධිපත්‍යයේ ස්වාධීනත්වය අවතක්සේරුවට ලක්වීමට හා නීතිය ක්‍රියාත්මක කිරීමේ අධිකාරීන් කෙරෙහි පවතින මහජන විශ්වාසය වීමට හේතු වේ. | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☒ | ☑ | ☑ | ☑ | ☑ |
| 5 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සුරක්ෂිත කර ඇති රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ඵලදායී හා අර්ථවත් ලෙස බලධාරීන් විසින් ක්‍රියාත්මක නොකරයි. | ☑ | ☑ | ☑ | ☑ | ☒ | ☒ | ☒ | ☑ | ☒ | ☑ |
| 6 | සමාජයේ මූලික අයිතිවාසිකම් සහ නිදහස පිළිබඳ මෙන්ම නීතියේ ආධිපත්‍යය පිළිබඳ සුපිළිඑන්නභාවයක් නොමැතිකම හේතුවෙන් පුද්ගලයන්ට, ඔවුන්ගේ පවුල්වලට මෙන්ම සමස්ථ සමාජයටම සිදුවන සමාජ, ආර්ථික හා මානසික බලපෑම සහ එහි පිරිවැය පිළිබඳ නිසි තක්සේරුවක් නොමැතිකම . | ☑ | ☑ | ☑ | ☒ | ☑ | ☒ | ☒ | ☒ | ☑ | ☑ |
| 7 | සමාජ සමගිය ප්‍රවර්ධනය කිරීමට සහ ප්‍රචණ්ඩ අන්තවාදය සඳහා ඇති විය හැකි මූලයන් අවම කිරීමට හේතුවන නීති ක්‍රියාත්මක කිරීමේ අඩු ලුහුඬුකම්. | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☒ | ☑ | ☑ | ☑ | ☑ |
| 8 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කොට ඇති වෙනස් කොට සැලකීම් පිටුදැකීමේ ප්‍රතිපාදන ක්‍රියාත්මක නොකිරීම සහ බහු සංස්කෘතික ප්‍රජාවක සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය සහතික කිරීම සඳහා වූ ස්ථිර ක්‍රියාමාර්ගයන් නොමැති වීම. | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☒ | ☑ | ☑ | ☑ | ☑ |
| 9 | රටේ බහු-සංස්කෘතික ජන විකාශනය පිළිබඳ දැනුම හා අවබෝධය ගොඩනගන උපාය මාර්ගයන් ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්‍රමයට ප්‍රමාණවත් ලෙස අන්තර්ගත නොවේ. | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☒ | ☑ | ☑ | ☑ | ☑ |
| 10 | සමාජ සහයෝගීතාව ප්‍රවර්ධනය කරන සහ ප්‍රචණ්ඩ අන්තවාදය ඇති විය හැකි මූල හේතු මුලිනුපුටා දැමෙන ප්‍රතිපත්තිමය ස්ථාවරයන්, උපාය මාර්ග, ක්‍රියාකාරී සැලසුම් පිළිබඳව පාසල් ගුරුවරුන්ට නිසි සංවේදීතාවයක් ඇති කිරීමට වැඩපිළිවෙලක් නොමැති වීම. | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ |

| | මූලික ගැටලු | ගැටලු සම්බන්ධයෙන් අවධාරණය කරන ලද විශ්වවිද්‍යාල | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | කොළඹ | නැගෙනහිර | යාපනය | කැළණිය | පේරාදෙණිය | රජරට | රුහුණ | සබරගමුව | අග්නිදිග | ශ්‍රී ජ'පුර |
| 11 | විශ්ව විද්‍යාල වල සහ අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන වල ආචාර්ය මණ්ඩල සමාජිකයන් සතු ජනවාර්ගික හා ආගමික වශයෙන් අන්තවාදී මතවාදයන් අනිවාර්යයෙන්ම සමාජ සංහිඳියාවට හානිකර ය. | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☒ | ☒ | ☑ | ☒ | ☑ |
| 12 | තරුණ සංසදවල සමානාත්මතාවයෙන් යුත් සැලකිල්ල සහ සාධාරණ අවස්ථා නොලැබීම පිළිබඳ අසතුටුදායක හැඟීම් පිළිබඳ ගැටළුව (උදා: තරුණ පාර්ලිමේන්තුව) සහ තරුණයින් සඳහා සමාන නියෝජනයක් සහිත ජාතික මට්ටමේ සංසදයක් නොමැති කම. | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ |
| 13 | සාධාරණ නියෝජනයක් පවතින පිළිගත හැකි ආයතනික යාන්ත්‍රණයක් සහිත අන්තර්කරණයෙන් යුත් ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලීන් අනුගමනය කිරීමට සැබෑ දේශපාලන කැමැත්තක් නොමැති වීම. | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ |
| 14 | බහු වාර්ගික හා ආගමික සහයෝගීතාවයන් පුනර්ජීවනය කිරීම සඳහා තරුණ අවබෝධය, දියුණුව පිළිබඳ ඔවුන්ගේ විශ්ලේෂණය, කලා හා ක්‍රීඩා කුසලතාවයන් ඵලදායීව භාවිතා කිරීමට සුදුසු උත්සාහයන් ගෙන නොමැති වීම. | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☒ | ☑ | ☑ | ☑ | ☑ |
| 15 | එක් ප්‍රජාවකට වාසිදායක වන අන්දමට කලාත්මක ධාරාවන් ඔස්සේ ගොඩනගන ලද අන්තවාදී මතවාද (උදා: චිත්‍රපටි, ටෙලි නාට්‍ය, ගීත ආදිය තුළින්) හරහා ප්‍රචණ්ඩ අන්තවාදයකට තුඩු දිය හැකි අවකාශය සමාජගත කිරීමේ හැකියාව. | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ |
| 16 | ඵලදායී අන්දමින් අන්තර් ආගමික, ජාතීන් අතර සහ අන්තර් සංස්කෘතික වශයෙන් හුවමාරු හා අන්තර් ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීමේ දී ශක්තිමත් මෙන්ම ඒ සඳහා අවැසි භෞතික හා මානව සම්පත් සපිරි ආයතනික සැකැස්මක් සහිත දිගු කාලීන උපාය මාර්ග නොමැති වීම. | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ |
| 17 | පුරවැසියන්ගේ බහු සංස්කෘතික මනෝභාවයන්ට බලපාන තීරණ ගැනීමට අවැසි බලතල සහ ඊට අදාළ කාර්ය කර්තව්‍යයන් ඇති නිශ්චිත රාජ්‍ය ආයතනවල තීරණ ගැනීමේ ව්‍යුහයන්හි නියෝජනය කිරීමට හා තනතුරු දැරීමට සමාන අවස්ථා සඳහා පවතින ඉඩ ප්‍රස්ථාව ප්‍රමාණවත් නොවීම. | ☒ | ☑ | ☑ | ☑ | ☑ | ☒ | ☒ | ☑ | ☑ | ☒ |
| 18 | බහුත්ව සමාජයක ප්‍රජාවන් සහ ආයතනික ව්‍යුහයන් අතර සැලකිය යුතු මට්ටමක විශ්වාස පිළිබඳ පරතරයක් පැවතීම සහ එමඟින් ප්‍රජාවන් අතර බැහැර කිරීමේ හැඟීම සහ බෙදීම් ඇති කරනු ලැබීම. | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☑ |
| 19 | ප්‍රධාන ධාරාවේ මාධ්‍ය සහ සමාජ මාධ්‍ය වල වගකීම් විරහිත වාර්තාකරණය සහ සදාචාර විරෝධී භාවිතයන් සහ අන්තවාදී ජනවාර්ගික හෝ ආගමික මතවාද වලින් උපුටා ගත් වැරදි තොරතුරු ප්‍රචාරය කිරීම ප්‍රචණ්ඩ අන්තවාදය ජනිත කිරීමට හේතු වේ. | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☒ | ☑ | ☒ | ☑ | ☑ |
| 20 | මැතිවරණ කාල වලදී පුළුල් හා නියාමනයකින් තොර මාධ්‍ය භාවිතය හරහා ජනවාර්ගික හා ආගම් කේන්ද්‍රීය දෘෂ්ටිවාදයන් තුළින් නොවැළැක්විය අයුරින් පුද්ගලයන්ගේ හැඟීම් ඇවිලවීම සිදුවීම වීම. | ☑ | ☑ | ☑ | ☑ | ☑ | ☒ | ☑ | ☒ | ☑ | ☑ |

# 5. මූලික ගැටලු, නෛතික තත්ත්වයන් සහ නිර්දේශ

| ප්‍රධාන ගැටලු | පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය, නෛතික සහ පරිපාලනමය රාමුව | ප්‍රධාන නිර්දේශ | ආයතනික/පාර්ශ්වකාර වගකීම |
|---|---|---|---|
| **මූලික අවධානය: අරමුදල් අයිතිවාසිකම්, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය, නීති සහ ජාත්‍යන්තර සම්මුතීන්** | | | |
| විවිධ ආගම්වල මිනිසුන්ට සමාන ගෞරවයක් හා රැකවරණයක් පිළිබඳ හැඟීමක් නොමැතිකම සහ සියලු ජනවාර්ගික හා ආගමික කණ්ඩායම් සඳහා අනන්‍යතාවක් නොමැති වීම ප්‍රචණ්ඩ අන්තවාදය සඳහා විභව මූලයන් යළිත් මතු වීමට හේතු වේ.<br><br>ආගමික ආයතන දේශපාලනීකරණය වීම ජනවාර්ගික හා ආගමික බෙදීම්වලට තුඩු දෙනු ඇත. එය වූ කලී බහු-ආගමික හා සංස්කෘතික සමාජයක ප්‍රජාවන්ගේ සමානාත්මතාවයේ හා සාධාරණත්වයේ වටිනාකම නිසි ලෙස හඳුනා නොගත් ප්‍රතිපත්ති හා භාවිතයන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමේ අවාසනාවන්ත ප්‍රතිඵලයකි. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදය<br><br>10 වන ව්‍යවස්ථාව. සෑම තැනැත්තකුටම තමන් අභිමත ආගමක් ඇදහීමේ හෝ වැලඳ ගැනීමේ නිදහස ද ලබ්ධියක් හෝ විශ්වාසයක් දැරීමේ හෝ පිළිගැනීමේ නිදහස ද ඇතුළුව සිතීමේ නිදහසට, හෘද සාක්ෂියේ නිදහසට සහ ආගමික නිදහසට හිමිකමක් ඇත්තේය. | බහු වාර්ගික හා ආගමික පසුබිම් නියෝජනය කරන ප්‍රජාවන්ගේ අනන්‍යතාවන්ට සහ නිදහසට ගරු කිරීමේ වැදගත්කම අවධාරණය කරන අතරම, ජනතාව ශ්‍රී ලාංකිකයන් ලෙස හඳුනා ගැනීම සඳහා පුළුල් ආකල්පමය පරිවර්තනයක් අවශ්‍ය වේ.<br><br>වර්තමාන ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ඓතිහාසික, සංස්කෘතික බහුත්ව සාමාජීය තත්ත්වයන් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම, සියලු ආගම් හා සංස්කෘතික වටිනාකම් සඳහා සමාන ව්‍යවස්ථාමය සහතිකයක් ලබා දීම සඳහා ප්‍රමාණවත් හා වැඩි අවධානයක් යොමු කළ යුතුය.<br><br>ආගම්වල දෘෂ්ටිවාදාත්මක හා අධ්‍යාත්මික අර්ථයන් වැලඳගැනීමේ වැදගත්කම අවබෝධ කර ගැනීම සඳහා මූලික පියවරක් අත්‍යවශ්‍ය වේ. ඊට අමතරව, දේශපාලන න්‍යායපත්‍ර සමඟ සමීපව සම්බන්ධ වීම හේතුවෙන් ප්‍රජාවන් බෙදීමට තුඩු දෙන සාධකයකයන් ප්‍රවර්ධනය කිරීම මෙන් නොව, විවිධත්වයට ගරු කිරීම වූ කලී පිළිගත් පොදු මිණුම්දණ්ඩකි. | පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීමේ මූලික වගකීම රජයට; එනම්, විධායකයට, ව්‍යවස්ථාදායකයට සහ අධිකරණයට ඇත.<br><br>පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන අවස්ථාවන්හිදී උද්දේශනය කිරීම ඇතුළුව අධීක්ෂණය සහ නිරන්තර නිරීක්ෂණයන් කිරීමේ වගකීම සිවිල් සමාජයට ඇත. |

| | | | |
|---|---|---|---|
| | | සංහිඳියාව වැලඳගැනීම සහ වාර්ගික හෝ ආගමික භේදය බැහැර කිරීම උදෙසා ප්‍රතිපත්ති සම්පාදකයින්, සිවිල් සමාජ ක්‍රියාකාරීන්, විද්වතුන්, මාධ්‍ය (ප්‍රධාන ධාරාවෙහි සහ සමාජ මාධ්‍ය), ආගමික නායකයින්, තරුණයින් සහ පුරවැසියන් ඇතුළු විවිධ පාර්ශ්වකරුවන් අතර ආකල්පමය පරිවර්තනයක් සඳහා කටයුතු කිරීමේ දැඩි අවශ්‍යතාවක් පවතී. | |
| නීතිය බලාත්මක කිරීම දේශපාලනීකරණය වීම හමුවේ නීතියේ ආධිපත්‍යය අඩපණ කිරීමට හේතු වන අතර නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් සහ ආයතන කෙරෙහි ඇති මහජන විශ්වාසය හීන කරනු ලබයි.<br><br>චේතනාන්විතව හෝ වෙනත් ආකාරයකින් සිදු වන වෙනස් කොට සැලකීමට තුඩු දෙන රාජ්‍ය තීන්දු බහුසංස්කෘතික සමාජයේ මිනිසුන්ගේ නීතියේ සමාන ආරක්ෂාවක් පිළිබඳ සැබෑ හැඟීම හෑල්ලුවට ලක් කරන දීර්ඝකාලීන බාධකයක් වශයෙන් අඛණ්ඩව හඳුනාගෙන තිබේ. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදය<br><br>12 (2) වන ව්‍යවස්ථාව.<br><br>නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය.<br><br>12 (2) වන ව්‍යවස්ථාව.<br><br>කිසිම පුරවැසියකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජන නොවිය යුත්තේය. | රාජ්‍ය නිලධරයන්ගේ, නීතිය බලාත්මක කිරීමේ බලධාරීන්ගේ සහ අධිකරණයේ ස්වාධීන ක්‍රියාකාරීත්වය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර රජය විසින් ගත යුතුය. ඒ අනුව බලධාරීන් විසින් ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීමේ දී සියලු මට්ටම්වල ආයතනික රාමුවල දීර්ඝකාලීනව පවතින සමාජ බැහැර කිරීම සහ හිතාමතා හෝ නොදැනුවත්ව ව්‍යුහාත්මක වෙනස්කම්වලට හෝ විශේෂයන්ට ලක් කිරීම් සමාලෝචනය කිරීම, නැවත අර්ථ දැක්වීම සහ අදාළ ගැටලු සඳහා විසඳුම් ලබා දීම කළ යුතුය.<br><br>තවද, ව්‍යවස්ථානුකූලව සහතික කර ඇති කිසිදු මූලික අයිතිවාසිකමක් යටපත් නොවන පරිදි, ව්‍යවස්ථා සම්පාදයකයන් විසින් ප්‍රචණ්ඩ අන්තවාදයේ මූල හේතු අවම කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතු අතර ප්‍රචණ්ඩ අන්තවාදය ප්‍රවර්ධනය කරන සහ සමාජ සහජීවනයට හා ජාතික සමගියට අහිතකර වන ක්‍රියාවන් අපරාධකරණය කළ යුතුය. | පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීමේ මූලික වගකීම රජයට; එනම්, විධායකයට, ව්‍යවස්ථාදායකයට සහ අධිකරණයට ඇත.<br><br>පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන අවස්ථාවන්හි දී උද්දේශනය කිරීම ඇතුළුව අධීක්ෂණය කිරීමේ සහ නිරන්තර නිරීක්ෂණයන් කිරීමේ වගකීම සිවිල් සමාජයට ඇත. |

| | | | |
|---|---|---|---|
| | | එවැනි ව්‍යවස්ථාදායක රාමුවලින් ප්‍රචණ්ඩ අන්තවාදයට ගොදුරු වන පුද්ගලයින්ට නීතිමය පිළියම් ලබාගත හැකි විය යුතුය.<br>ජනතාවගේ බහු සංස්කෘතික හැඟීම්වලට බලපාන තීරණ ගැනීමට බලතල සහිත විශේෂිත රාජ්‍ය ආයතනවල සංයුතිය තීරණය කිරීමේදී ඒවායෙහි නියෝජනත්වය සම්බන්ධයෙන් බලධාරීන් සැලකිලිමත් විය යුතුය. එබැවින් එවැනි ආයතන සඳහා බඳවා ගැනීම් සම්බන්ධයෙන් ගත් කළ (පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කෞතුකාගාරය, ජාතික ලේඛනාගාර දෙපාර්තමේන්තුව, බෞද්ධ, හින්දු, මුස්ලිම් හා ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව, ජාතික සංහිඳියා කාර්යංශය, මධ්‍යම සංස්කෘතික අරමුදල, ජාතික චිත්‍රපට සංස්ථාව සහ රාජ්‍ය භාෂා කොමිෂන් සභාව) තීරණ ගැනීමේ තනතුරු නියෝජනය කිරීමට හා දැරීමට සමාන අවස්ථා සඳහා අවකාශය නිරූපණය කළ යුතුය. | |
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය [Official Language Policy (OLP)] බලධාරීන් ඵලදායී හා අර්ථවත් ලෙස ක්‍රියාත්මක නොකරයි.<br>බහු වාර්ගික සමාජය අතර අන්තර්ක්‍රියාකාරීත්වයට ඇති අවස්ථාවන් ගිලිහී යෑමේ ප්‍රතිඵලය වූයේ ව්‍යවස්ථාමය | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදය - භාෂාව<br>18 වන ව්‍යවස්ථාව. (13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත)<br>(1) ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂාව සිංහල භාෂාව වන්නේය. | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ හා අනිවාර්ය රාජ්‍ය ආයතන සියල්ලම අවශ්‍ය පියවර ගත යුතුය. සාමය හා සමගිය සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට විධිමත් ආයතන පහසුකම් ලබා දීම හා සම්බන්ධීකරණය සිදු කළ යුතුය. | රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය.<br>රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව<br>රාජ්‍ය භාෂා කොමිෂන් සභාව<br>ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය |

| | | | |
|---|---|---|---|
| හා වෙනත් ව්‍යවස්ථාදායක විධිවිධාන දුර්වල ලෙස ක්‍රියාත්මක කිරීම හා ප්‍රජාවන් අතර වර්ධනය වන සැකය හා අවිශ්වාසය තව තවත් නරක අතට හැරීමයි. මේ අනුව, කෙටි, මධ්‍යම හා දිගුකාලීන උපායමාර්ග නොමැතිකම සහ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් නොමැති වීම, ප්‍රචණ්ඩ අන්තවාදයේ මූල හේතු ඉස්මතු වීම කෙරෙහි වැඩි බලපෑමක් ඇති කරයි. | (2) දෙමළ භාෂාවද රාජ්‍ය භාෂාවක් වන්නේය.<br><br>19 වන ව්‍යවස්ථාව.<br><br>සිංහල භාෂාව සහ දෙමළ භාෂාව ශ්‍රී ලංකාවේ ජාතික භාෂා වන්නේය.<br><br>16 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ප්‍රකාරව ගත් කල,<br><br>21 වන ව්‍යවස්ථාව (ඉගැන්වීමේ මාධ්‍ය); 22 වන ව්‍යවස්ථාව (පරිපාලන භාෂාව); 23 වන ව්‍යවස්ථාව (නීති පැනවීමේ භාෂාව); 24 වන ව්‍යවස්ථාව (අධිකරණවල භාෂාව) ආදී විධිවිධානයන් ඔස්සේ භාෂාමය අයිතිවාසිකම් තවදුරටත් ශක්තිමක් කර තිබේ.<br><br>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලව සහතික කරන ලද රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පහත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංකः 18/2009 මගින් තවදුරටත් ඌනපූරණය කර තිබේ;<br><br>"රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය බලාත්මක කිරීම සඳහා ප්‍රධාන රාජ්‍ය භාෂා ක්‍රියාත්මක කිරීමේ නිලධාරියාගේ සහ රාජ්‍ය භාෂා ක්‍රියාත්මක කිරීමේ නිලධාරියාගේ වගකීම් ගැසට් නිවේදනය ඔස්සේ දැක්වීමට රජය තීරණය කර තිබේ." | තවද, රාජ්‍ය භාෂා භාවිතය සම්බන්ධ ප්‍රතිපත්ති මූලධර්ම නිර්දේශ කිරීමට සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඩ් වන පරිච්ඡේදයේ අඩංගු විධිවිධානවලට අනුකූල වීම නිරීක්ෂණය හා අධීක්ෂණය කිරීම සඳහා රාජ්‍ය භාෂා කොමිෂන් සභාව සක්‍රියව ක්‍රියාමාර්ග ගැනීම මෙන්ම රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි වටිනාකම ඉස්මතු කිරීම සහ එහි තත්ත්වය, සමානාත්මතාව සහ භාවිතයේ අයිතිය පිළිගැනීම, සහ අඛණ්ඩව පවත්වාගෙන යෑම ප්‍රවර්ධනය කිරීමට අවැසි පියවර ගත යුතුය.<br><br>රාජ්‍ය භාෂා කොමිෂන් සභාව ස්වාධීන කොමිසමක් බවට පරිවර්තනය කර අදාළ බලධාරීන් විසින් එය ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුය. එවැනි ස්වාධීන කොමිෂන් සභාවකට භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අනුකූල නොවන නිලධාරීන්ව වගවීමට ලක් කිරීම සඳහා බලාත්මක කළ හැකි බලතල සහිත පැහැදිලි ආයතනික පසුබිමක් ස්ථාපිත කළ යුතුය.<br><br>තවද, අදාළ බලධාරීන් විසින් පළාත් මට්ටමේ රාජ්‍ය භාෂා කොමිෂන් සභා පිහිටුවීමට අවැසි පියවර ගත යුතුය. | සියලුම ප්‍රධාන රාජ්‍ය භාෂා ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන් [Chief Official Language Implementing Officers (COLIOs)] සහ රාජ්‍ය ආයතනවල රාජ්‍ය භාෂා ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන් [Official Language Implementing Officers (OLIOs)]. |

| | | | |
|---|---|---|---|
| ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සහ ඊට අදාළ රෙගුලාසි වැනි ඇතැම් නීති සහ රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ දී පවතින අනිසි භාවිතයට ඇති විභව හැකියාව හේතුවෙන්, ප්‍රචණ්ඩ අන්තවාදයට මූලික හේතු නැවත නැවත උද්ගත වීම සඳහා තවදුරටත් උත්ප්‍රේරකයක් සපයයි. එමගින් ප්‍රජාවන් තුළ සහ ජනකොටස් අතර සබැඳියාවන් තවදුරටත් දුරස් විය හැකි අතර ජාතික සමගිය සම්බන්ධයෙන් කෙටිකාලීන හා දිගුකාලීනව පවත්නා ප්‍රතිවිපාක ඇති කළ හැකිය.<br><br>ඊට අමතරව, මෙවන් නෛතික තත්ත්වයන්හි සමාජ-ආර්ථික හා පුද්ගල මානසික බලපෑම පිළිබඳව ඇගයීම සහ පුරවැසියන්ගේ, ඔවුන්ගේ පවුල්වල මෙන්ම පොදුවේ සමාජයේ මූලික අයිතිවාසිකම් සහ නන්වැදෑරුම් නිදහස කෙරෙහි වියහැකි අගතිගාමී බලපෑම මෙන්ම මෙරට නීති පද්ධතියේ සහ නීතියේ ආධිපත්‍යයේ සුපිළිපන්භාවයට ඇති බලපෑම සම්බන්ධයෙන් ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීමේ දී සැලකිලිමත් විය යුතුය. | වර්ෂ 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ ජනාධිපතිවරයා විසින් නිකුත් කරන ලද රෙගුලාසි; වර්ෂ 2021 මාර්තු 12 දිනැති අංක 2218/68 අතිවිශේෂ ගැසට් නිවේදනය, "ත්‍රස්තවාදය වැළැක්වීම (දැඩි අන්තගාමී ආගමික මතවාද දැරීමෙන් මුදවාගැනීමේ) 2021 අංක 01 දරන රෙගුලාසි" ලෙස සඳහන් කර ඇත. 'කියනු ලබන හෝ කියවීමට අදහස් කරනු ලැබූ වචන වලින් හෝ සංඥා මගින් හෝ දෘශ්‍ය නියෝජන මගින් හෝ අන්‍යාකාරයෙන් සාහසික ක්‍රියා හෝ විවිධ ජනකොටස් නැතහොත් වර්ගීය හෝ ආගමික කණ්ඩායම් අතර ආගමික වර්ගීය නැතහොත් ජාතිවාදී අසංගතිය නැතහොත් දුර්චේතනික හෝ එදිරිවාදී හැඟීම් ඇතිවීමට සලස්වන්නා වූ හෝ ඇති වීමට සැලැස්වීමට අදහස් කරන්නා වූ හෝ තැනැත්තකු ලෙස සැක කරන යම් තැනැත්තකු භාර වන හෝ අත්අඩංගුවට ගනු ලබන අවස්ථාවකදී' මේ නියෝගවල විධිවිධාන ප්‍රකාරව පුනරුත්තාපන ක්‍රියාවලියක් සඳහා යොමු කළ හැකිය. | ප්‍රචණ්ඩත්වය, අන්තවාදී ක්‍රියාකාරකම්, ත්‍රස්තවාදය වැළැක්වීම, විරෝධතා සහ පෙළපාලි වැනි ක්ෂේත්‍රවල නෛතික රාමුවලට බලපාන නීති, රෙගුලාසි, විධායක නියෝග සහ වෙනත් පරිපාලන හෝ ව්‍යවස්ථාපිත විධිවිධාන සකස් කිරීම, බලාත්මක කිරීම සහ බලාත්මක කිරීම සම්බන්ධයෙන් ගත් කල ඒවා සමස්ත නෛතික ක්‍රමයේ ප්‍රතිසංස්කරණවල අන්තර්ගත අංගයක් වශයෙන් ඒවාට අදාළ සියලු අනුෂංගික තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් සිදු කිරීමට අදාළ නීති සම්පාදකයන් සහ බලධාරීන් විසින් පියවර ගත යුතුය. එවැනි විධිවිධාන සැකසීමේ දී ඒවා මගින් බලපෑමට ලක් වන පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් සහ නිදහස පිළිබඳ පූර්ණ විශ්ලේෂණයක් ඇතුළත් විය යුතු අතර ඒවා බලාත්මක කිරීමට පෙර පුළුල් සමාජ කතිකාවක් සහ අදහස් සලකා බැලීමක් අන්තර්ගත විය යුතුය.<br><br>එවැනි නීති සහ රෙගුලාසි සම්පාදනය කිරීමේදී උද්ගත විය හැකි සමාජ-ආර්ථික හා මානසික බලපෑම සහ එහි පිරිවැය තක්සේරු කිරීමට සහ ජාතික සහජීවනය සහ ඒකාබද්ධතාව පෝෂණය කිරීමේ සන්දර්භය තුළ නුසුදුසු විධිවිධාන ක්‍රියාත්මක කිරීම අහෝසි කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගත යුතුය. | ආණ්ඩුවේ විධායකය, නීති සම්පාදකයින්, ප්‍රතිපත්ති උපදේශන ආයතන, නීතිපති දෙපාර්තමේන්තුව, නීතිය බලාත්මක කිරීමේ බලධාරීන් සහ අධිකරණය. |

| | | | |
|---|---|---|---|
| සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය වැනි මානව හිමිකම් හා බැඳි ජාත්‍යන්තර මෙවලම් හි සඳහන් විධිවිධානයන් පිළිපැදීමට රජය දක්වන කැපවීම නීත්‍යානුකූල තත්ත්වයට පත් කර ඇති දේශීය වශයෙන් පවත්නා නෛතික හා ප්‍රතිපත්තිමය විධිවිධාන නිසි පරිදි ක්‍රියාත්මක නොවීම.<br><br>සංහිඳියාව සහ සමාජ ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රචණ්ඩ අන්තවාදය සඳහා හේතු වන විභව මූලයන් මුලිනුපුටා දැමීමට අපේක්ෂා කරන අදාළ නීති ක්‍රියාත්මක කිරීමේ පරතරයක් පැවතීම මෙරට සන්දර්භය තුළ පොදු සංසිද්ධියකි. කිසිදු බියකින් තොරව සමාජයේ ජීවිත හා දේපළ විශාල වශයෙන් විනාශයට කිරීම සඳහා ප්‍රචණ්ඩ අන්තවාදයේ ක්‍රියාවන් අවුළුවාලීමට එය අනිවාර්යයෙන්ම අසීමිත ඉඩ ප්‍රස්ථාවක් සපයයි. | වර්ෂ 2007 අංක 56 දරන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (අයිසීසීපීආර්) පනතේ 3 (1) වගන්තියෙහි දැක්වෙන්නේ "කිසිම පුද්ගලයෙක් යුද්ධය ප්‍රවර්ධනය නොකළ යුතු අතර වෙනස් කොට සැලකීම, සතුරුකම හෝ ප්‍රචණ්ඩත්වයට පොළඹවන ජාතික, වාර්ගික හෝ ආගමික වෛරය වෙනුවෙන් පෙනී නොසිටිය යුතුය. තවද, 3 වන වගන්තියේ (2) සහ (3) වැනි උපවග න්ති (1) වැනි උපවගන්තියේ දක්වා ඇති ක්‍රියාවන් සිදු කරන අයව අපරාධයක් සිදුකරනු ලබන වරදකරුවන් වශයෙන් පෙන්වාදීමට විධිවිධාන සලසයි. | වෙනස් කොට සැලකීම ප්‍රවර්ධනය කිරීම සහ වෙනස් කොට සැලකීම සහ ප්‍රචණ්ඩත්වය කෙරෙහි උත්තේජනය ඇති කරනු ලබන ක්‍රියාවන් තහනම් කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් දැනට පවතින නීතිමය විධිවිධාන නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතුය. | රටේ නීතිය ක්‍රියාත්මක කරන ආයතන, බලධාරීන් සහ අධිකරණය. |
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය වශයෙන් සහතික කර ඇති වෙනස් කොට සැලකීම් බැහැර කරනු ලබන විධිවිධාන බලාත්මක කිරීමේ ඌනතාවට අමතරව, බහු සංස්කෘතික ප්‍රජාවක සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සහතික කිරීම සඳහා නිසි පියවර ගැනීම අඛණ්ඩව නොසලකා හැරීම සහ එවන් අයිතිවාසිකම් සහතික කිරීමේ විධිමත් හා සාධනීය ක්‍රියාමාර්ග නොමැති වීම. | ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ ෂෂ වන කොටසෙහි (2) වන වගන්තියේ සඳහන් වන පරිදි, ''වර්ණය, ස්ත්‍රී පුරුෂ භාවය, භාෂාව, ආගම, දේශපාලන හෝ වෙනත් මතය, ජාතික හෝ සමාජ සම්භවය, දේපළ, උපත හෝ වෙනත් තත්වයක් මත කිසිදු තැනැත්තකු කිසිදු වෙනස්කමකට භාජනය නොකිරීමට පාර්ශවකාර රාජ්‍යයන් විසින් පියවර ගත යුතුය.'' | බහුසංස්කෘතික පසුබිම් නියෝජනය කරන පුද්ගලයින් වෙනස් කොට සැලකීම්වලින් තොරව සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් සමානව භුක්ති විඳින බවට සහතික කිරීමට අවැසි ක්‍රියාමාර්ග අදාළ රාජ්‍ය ආයතන මගින් ගත යුතුය. | රටේ නීතිය ක්‍රියාත්මක කරන ආයතන, බලධාරීන් සහ අධිකරණය. |

| මූලික අවධානය: ප්‍රාථමික, ද්විතීයික සහ උසස් අධ්‍යාපනය | | | |
|---|---|---|---|
| රටේ බහු සංස්කෘතික ජන විකාශනය පිළිබඳ දැනුම හා අවබෝධය ගොඩනංවන උපායමාර්ගික රාමු ප්‍රමාණවත් හා සවිස්තරාත්මකව ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්‍රමයට ඇතුළත් වී නොමැත.<br><br>තවද, පාසල් විෂයමාලාවේ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලීන්හි දී විවිධත්වයේ හා විසම්මුතියේ සාරධර්ම කෙරෙහි ගෞරවය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතික සහජීවනය හා සමගිය ගොඩනැගීම සඳහා ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයට අදාළ සිසුන්ගේ හා ගුරුවරුන්ගේ විභව හැකියාවන් ඉස්මතු කර භාවිත කිරීමේ සැලසුම් ප්‍රමාණවත් ලෙස ඇතුළත් කර නොමැත.<br><br>ප්‍රචණ්ඩ අන්තවාදය ඇති විය හැකි මූල හේතු ඉවත් කිරීම පිළිබඳ ප්‍රතිපත්තිමය ස්ථාවරයන්, උපායමාර්ග, සමාජ සහජීවනය ප්‍රවර්ධනය කරන ක්‍රියාකාරී සැලසුම් සම්බන්ධයෙන් ගුරුවරුන්ට නිසි දැනුවත් කිරීමක් නොමැතිකම විශේෂයෙන් සැලකිය යුතු ගැටලුවක් වශයෙන් හඳුනාගෙන ඇත. සංහිඳියාව සහ සමාජ ඒකාබද්ධතාව කෙරෙහි ගුරුවරුන්ගේ ජනවාර්ගික හා ආගම් කේන්ද්‍රීය මතවාදයන්ගේ අහිතකර බලපෑම සම්බන්ධයෙන් අධ්‍යාපන බලධාරීන් ප්‍රමාණවත් ලෙස අවධානය යොමු කර නොමැති වීම එක් මූලික ගැටලුවකි. | රටේ අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය මූලික වශයෙන් වගකිව යුතුය.<br><br>වර්ෂ 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනතේ විධිවිධාන අනුව ශ්‍රී ලංකාවේ ජාතික අධ්‍යාපන ආයතනය (හෂෘ) අධ්‍යාපන කළමණාකරුවන්ගේ, ගුරු අධ්‍යාපන උපදේශකයන්ගේ සහ ගුරුවරුන්ගේ ධාරිතා වර්ධනය සහතික කිරීම, පාසල් විෂයමාලා සහ ප්‍රතිපත්තිය සැලසුම් වලට අදාළ පර්යේෂණ කිරීම සහ සංවර්ධනය කිරීම තුළින් බහුත්ව සමාජයේ සමානාත්මතාවය හා පවතින සමාජ පසුබිමට අනුකූල වන පරිදි අධ්‍යාපනය සංවර්ධනය කිරීම සඳහා නායකත්වය සැපයීම සඳහා අවැසි ව්‍යුහයන් පෙන්වා දී ඇත.<br><br>අධ්‍යාපන ප්‍රතිපත්තියේ කාලීන පැවැත්ම සහතික කිරීම සහ අධ්‍යාපන පද්ධතියට ප්‍රතිචාර දැක්වීමට හැකි වන පරිදි, සෑම අංශයකින්ම අධ්‍යාපන ප්‍රතිපත්තිය පිළිබඳව ජනාධිපතිවරයාට නිර්දේශ ලබා දීමේ වරම සමඟ වර්ෂ 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත යටතේ ස්ථාපිත කරන ලද ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවට බලතල ලබා දී ඇත. | විවිධ ජනවාර්ගික හා ආගමික සංස්කෘතීන් පිළිබඳ දැනුම හා අවබෝධය ගොඩනංවන අන්දමේ විෂය කරුණු පවත්නා විෂයයකට හෝ සුදුසු විෂයයන්වලට හෝ අන්තර්ගත කිරීම් හෝ අලුතෙන් ඇතුළත් කිරීම සඳහා ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන අංශයේ ප්‍රතිසංස්කරණ අවශ්‍ය වේ. මේ අනුව, පාසල් විෂය මාලාව ප්‍රතිසංස්කරණය කිරීමෙන් විවිධත්වයේ හා විසම්මුතියේ සාරධර්ම කෙරෙහි ගෞරවය ඇති වේ.<br><br>තවද, එවැනි ඕනෑම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියකට කලාව, ක්‍රීඩා, විනෝදාස්වාදය සහ විවේකය ඇතුළුව වර්තමානයෙහි පවත්නා විෂයමාලාවන් සහ විෂය බාහිර ක්‍රියාකාරකම්වල අන්තර්ගත නිත්‍ය විෂයයන් පිළිබඳ පුළුල් තක්සේරුවක් හා සමාලෝචනයක් ඇතුළත් විය යුතු අතර පොදු පරිහරණය, අන්‍යෝන්‍ය අවබෝධය ගොඩනැගීම, විශ්වාසය, ආත්ම අභිමානය, ත්‍යාගශීලීත්වය සහ නිර්මාණශීලීත්වය යන ගුණාංග සැබවින්ම ප්‍රවර්ධනය කරන අන්දමින් ක්‍රියාත්මක කළ හැකි ක්‍රියාකාරී සැලසුම් ස්ථාපිත කිරීම සහතික කළ යුතුය.<br><br>ජාතික හා පළාත් මට්ටමින් පාසල් සඳහා වාර්ෂිකව "ජාතික බහු සංස්කෘතික පාසල් වැඩසටහනක්" ස්ථාපිත කිරීමට අදාළ බලධාරීන් විසින් කටයුතු කළ යුතුය. සාධාරණ හා සියලුදෙනාගේ අන්තර්කරනයෙන් යුත් සමාජයක් | සම්බන්ධීකරණයකින් කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| | | ගොඩනැගීම සඳහා ඉවසීම සහ අන්තර් සංස්කෘතික දැනුම සහ අවබෝධය ප්‍රවර්ධනය කිරීම සඳහා අදාළ පාර්ශවයන් සමඟ විධිමත්ව පවත්වන විශ්ලේෂණාත්මක උපදේශන ක්‍රියාවලියකින් යුතුව එවැනි වැඩසටහනක් සැලසුම් කර දියත් කළ යුතුය. නිදසුනක් වශයෙන්, සෑම දරුවෙකුටම 'ආගම් සම්බන්ධ විෂයයෙන් 30% ක් වෙනත් ආගම් ඉගෙන ගැනීමට භාවිතා කිරීමට හැකිවන පරිදි අවස්ථාව තිබිය යුතුය.<br><br>අධ්‍යාපන පද්ධතිය තුළ වඩාත් වැදගත් ආකල්පමය වෙනසක් සඳහා උපායමාර්ග සකස් කිරීම සඳහා අව්‍යාජ දේශපාලන කැපවීමකින් සහ අධිෂ්ඨානයකින් යුතුව රජයේ මැදිහත්වීමේ අවශ්‍යතාව බලධාරීන් විසින් සොයා බැලිය යුතුය.<br><br>අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සමඟ එක්ව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ මන්දගාමී ප්‍රගතිය සම්බන්ධයෙන් සමාලෝචනය කළ යුතු අතර අවශ්‍ය සංශෝධන සමඟ ඵලදායී ලෙස එකී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා උපාය මාර්ග සකසා ගත යුතුය. බලධාරීන් විසින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ ආයතනික හැකියාව, ස්වාධීනත්වය, බලතල තවදුරටත් ශක්තිමත් කළ යුතුය. එහි බලතල ජනාධිපතිවරයාට උපදෙස් දීමට පමණක් සීමා නොවී අධ්‍යාපන ක්ෂේත්‍රයේ අනෙකුත් අදාළ ආයතන වෙත ද අදාළ වන පරිදි ව්‍යාප්ත කළ යුතුය. | |

| | | | |
|---|---|---|---|
| රටේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ පිහිටුවා ඇති විශ්වවිද්‍යාල සහ වෘත්තීය පුහුණු ආයතන, ඩිප්ලෝමා ආයතන සහ විද්‍යාපීඨවල ගුරු කාර්යමණ්ඩලයේ ආකල්ප කෙරෙහි ජනවාර්ගික හා ආගමික මතවාදයන්ගේ බලපෑම අනිවාර්යයෙන්ම සමාජ සහජීවනයට අහිතකර ය.<br><br>බහු සංස්කෘතික සමාජයක සංහිඳියාවට සහ සහජීවනයට සෘජුවම බලපාන එවැනි ප්‍රතිවිරෝධතා තත්ත්වයන්හි ප්‍රතිවිපාක ජනවාර්ගික, ආගමික, අන්‍යෝන්‍ය අවබෝධය ප්‍රවර්ධනය කරන සහ උසස් අධ්‍යාපන ආයතනවල තරුණයින්ගේ සංස්කෘතික අනන්‍යතා පිළිබඳ අවබෝධය ඉහළ නංවන විධික්‍රම අදාළ පාඨමාලා අන්තර්ගතයන් තුළ සහ ඉන් පිටත නිසි උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මක් සහිතව ස්ථාපිතව නොමැතිකම මගින් පවතින සංකීර්ණ තත්ත්වය තවදුරටත් උග්‍ර වේ. | මෙරට උසස් අධ්‍යාපන ආයතනවලින් නික්මයන තරුණ ප්‍රජාවෙහි ත්‍රිත්වාකාර පදනම වන සමාජ, පාරිසරික සහ මූල්‍ය යන අංශයන්හි සාමාජීය පැතිකඩෙහි ගුණාත්මකභාවය ඉහළ නැංවීමට අවශ්‍ය ආයතනික බලතල උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධිත ආයතනික රාමුවලට අදාළ, ප්‍රධාන වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට සහ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවට ඇත.<br><br>මීට අමතරව, වර්ෂ 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතේ විධිවිධානවලට අනුව, රට තුළ ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම් කිරීම, තත්ත්ව සහතික කිරීම, සම්බන්ධීකරණය හා සංවර්ධනය සඳහා අවැසි පියවර ගැනීමට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවට බලය ඇත. | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති යෝජනා (වර්ෂ 2019 දෙසැම්බර්) වල අරමුණු වලට අනුකූලව බලධාරීන් විසින් වර්තමාන උසස් අධ්‍යාපන ක්‍රමය පිළිබඳ පුළුල් සමාලෝචනයක් සිදු කළ යුතුය. උසස් අධ්‍යාපන ආයතනවල 'ප්‍රජාතන්ත්‍රවාදී සහ වගකිවයුතු පුරවැසිභාවයක් ස්ථාපිත කිරීම සඳහා විවිධත්වය, බහුත්වවාදය, සමාජ සමගිය සහ මානව සහයෝගීතාවයේ සාරධර්ම කෙරෙහි සමාජ දැනුවත්භාවය සහ සංවේදීතා' ප්‍රවර්ධනය කරන වැඩසටහන් ස්ථාපිත කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හා නව්‍ය ප්‍රවේශයන් හඳුන්වා දීමට උසස් අධ්‍යාපන බලධාරීන් වහාම පියවර ගත යුතුය.<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපනය සඳහා අදාළ අනෙකුත් රාජ්‍ය ආයතන ඔවුන්ගේ දැක්ම, මෙහෙවර සහ අරමුණු තුළ 'රටේ ජාතික සමගිය හා සමාජ සහජීවනය කෙරෙහි දැඩි උනන්දුවක් දක්වන දැනුමැති නායකයින් ඔවුන්ගේ ආයතනික අංගයක් ලෙස නිර්මාණය කිරීමේ' අංගය පැහැදිලිව ඇතුළත් වන පරිදි සංශෝධනය කිරීමට නැවත සලකා බැලිය යුතුය. | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපනයට අදාළ බලයලත් අනෙකුත් ආයතන සමඟ සහයෝගයෙන් සහ නිසි සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම. |

| මූලික අවධානය: ජාතික තරුණ ප්‍රතිපත්තිය සහ තරුණයන්, සාමය සහ ආරක්ෂාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ යෝජනාව | | | |
|---|---|---|---|
| තරුණ සංසදවල (උදා: තරුණ පාර්ලිමේන්තුව) සමානාත්මතාවයෙන් යුත් සැලකිලි සහ සාධාරණ අවස්ථා පිළිබඳ සෑහීමකට පත් විය නොහැකිය යන මතවාදය පිළිබඳ ගැටලුව සහ ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීම සඳහා තරුණ පරම්පරාවේ විභව ශක්තීන් ප්‍රශස්ත ලෙස භාවිත නොකිරීමේ සන්දර්භය තුළ තරුණ ප්‍රජාවෙහි අදහස් සහ යෝජනා ඉදිරිපත් කරනු ලැබිය හැකි ජාතික මට්ටමේ වේදිකාවක් නොමැති වීම.<br><br>ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ ක්‍රියාවලීන් සඳහා තරුණයින්ගේ ඵලදායී, ක්‍රමානුකූල හා අර්ථවත් සහභාගීත්වයක් නොමැතිකම රටේ වර්තමාන ප්‍රතිපත්ති කතිකාවේ සැලකිය යුතු රික්තයකි. එවැනි සංසද නියෝජනය කිරීමට අපක්ෂපාතී හා සමාන අවස්ථා නොමැති වීම සහ පිළිගත හැකි ආයතනික යාන්ත්‍රණයක් සමඟ අන්තර්කරණයෙන් යුත් ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලීන් සඳහා අව්‍යාජ දේශපාලන කැපවීමක් සහ අධිෂ්ඨානයක් නොමැතිවීම තරුණ පරපුරේ හඬ නොසලකා හැරීමට හේතු වී තිබේ. | **ජාතික තරුණ ප්‍රතිපත්තිය - 2014**<br><br>6 වන පරිච්ඡේදය: ජාතික තරුණ ප්‍රතිපත්තියේ ප්‍රධාන උපාය මාර්ග සහ ප්‍රතිපත්තිමය මැදිහත්වීම පිළිබඳ කොටස මගින් සමාජ බැහැර කිරීම් සහ වෙනස් කොට සැලකීම් විසඳීම සඳහා ක්ෂණික ප්‍රතිපත්තිමය මැදිහත්වීම්වල අවශ්‍යතාවය දැඩිව අවධාරණය කරනු ලබයි. තරුණ කටයුතු පිළිබඳ ඔම්බුඩ්ස්මන් තනතුරක් ස්ථාපිත කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා වන යෝජනාව මෙම ප්‍රතිපත්තියට ඇතුළත් වන අතර ජාතික මට්ටමින් තරුණ තරුණියන්ගේ අර්ථවත් සහභාගීත්වය සඳහා වඩා හොඳ අවස්ථාවන් සහ අවකාශයන් නිර්මාණය කිරීමේ අවශ්‍යතාව එමගින් නැවත අවධාරණය කරනු ලබයි.<br><br>"තරුණයන්, සාමය සහ ආරක්ෂාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල 2250 යෝජනාව"<br><br>"විවිධ සමාජ පසුබිම්වල සිටින තරුණ තරුණියන් ඇතුළු තරුණ ක්‍රියාකාරීන් හඳුනාගෙන ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට සහ සමාජ සහජීවනය ප්‍රවර්ධනය කිරීමට සහාය ලබා ගැනීමට ප්‍රමාණවත් පසුබිමක් සකසා දෙන තත්වයක් ස්ථාපිත කිරීම සඳහා පහසුකම් සපයන ලෙස පාර්ශ්වකාර රාජ්‍යයන්ගෙන් ඉල්ලා සිටී." | ජාතික තරුණ ප්‍රතිපත්තියේ යෝජිත හා එකඟ වූ ප්‍රතිපත්ති යෝජනාවල ක්‍රියාවලීන් හා කාර්යසාධනය තක්සේරු කිරීම හා ඇගයීම සඳහා තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ස්වාධීන කමිටුවක් පත් කළ යුතුය. ඒ අනුව, නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් යටිතල පහසුකම් සහ නම් කරන ලද නිලධාරීන්ගේ වගවීම ඇතුළත් අධීක්ෂණ හා ඇගයීම් යාන්ත්‍රණයක් සැලසුම් කිරීමට පියවර ගත යුතු වේ.<br><br>තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය උසස් අධ්‍යාපන ආයතන, ශිෂ්‍ය සංගම් සහ යෞවන සමාජ සංසද සමඟ සමීප සහයෝගීතාවයක් පවත්වා ගත යුතු අතර සමාජ සහජීවනයට අදාළ වැඩපිළිවෙළවල් අර්ථවත් ලෙස සැලසුම් කිරීමේදී සහ අනෙකුත් කරුණු අතර, ජාතික සහජීවනය අරමුණු කරගත් ප්‍රතිපත්තිමය ස්ථාවරයන් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී තරුණයින් සමඟ සම්බන්ධ වීමට ඇති සියලු අවස්ථාවන් ගවේෂණය කිරීම සහ භාවිත කිරීමට පියවර ගත යුතුය. | තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය මූලික වගකීම දරයි. |

| | | | |
|---|---|---|---|
| කැබිනට් අමාත්‍යධුරයක් වන තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ජාතික තරුණ සේවා කවුන්සිලයෙහි එක් සාරධර්මයක් වශයෙන්; ''විවිධ සංස්කෘතීන්ගෙන් සමන්විත සමූහයක් ලෙස යෞවනයන් අතර බහු සංස්කෘතික අවබෝධය සහ හොඳහිත නිරන්තරයෙන් ප්‍රවර්ධනය වන අයුරින් ක්‍රියා කරන්න'' යනුවෙන් පෙන්වා දී ඇත.<br><br>කෙසේ වෙතත්, තරුණ අවබෝධය ඵලදායී ලෙස භාවිත කිරීමට දරන සාධනීය උත්සාහයන් නොමැති පසුබිමක, බහුවාර්ගික හා ආගමික සහයෝගීතාවන් පුනර්ජීවනය කිරීම සඳහා සංවර්ධනය, කලා හා ක්‍රීඩා පිළිබඳ ඔවුන්ගේ විශ්ලේෂණය නොසලකා හැරීම මෙරට බහුසංස්කෘතික සමාජ සන්දර්භය තුළ ඇති ප්‍රධාන අභියෝගයකි. මීට අමතරව, කලාත්මකව සැකසූ අන්තවාදී මතවාදයන් සමාජගත කිරීම සඳහා විශාල ඉඩ ප්‍රස්ථාවක් නිර්මාණය වී ඇති අතර, (උදා: චිත්‍රපට, ටෙලිනාට්‍ය, ගීත ආදිය හරහා) ඒවා එක් ප්‍රජාවකට වාසිදායක වන අතර තවත් ප්‍රජාවකට හානිකර වන අන්දමින් ප්‍රචණ්ඩ අන්තවාදය දෙසට සමාජ බළ මුළු ගැන්වීමට තුඩු දිය හැකිය. ඊට අමතරව, ඵලදායී අන්තර් වාර්ගික සම්බන්ධතා, අන්තර් ආගමික සබඳතාවන් හා අන්තර් සංස්කෘතික හුවමාරු සහ අනෙකුත් අන්තර් සමාජීය ක්‍රියාවන් ප්‍රවර්ධනය කිරීමේදී ශක්තිමත් හා ප්‍රමාණවත් සම්පත්දායකත්වයකින් යුක්ත ආයතනික සැකසුමක් සහිත දිගුකාලීන උපායමාර්ග | **ජාතික තරුණ ප්‍රතිපත්තිය - 2014**<br><br>ජාතික තරුණ ප්‍රතිපත්තියේ අරමුණු අංක 3.3 යළිත් අවධාරණය කරනු ලබන්නේ මෙරට තුළ ජනවාර්ගිකත්වය, සංස්කෘතිය, ආගම, භාෂාව සහ ජීවන රටාවන්හි විවිධත්වයන් හඳුනාගෙන ඒවාට ගරු කරන අතරම තරුණ තරුණියන් අතර සමාජ වගකීම සහ සමාජ සහජීවනය පිළිබඳ හැඟීමක් ඇති කිරීමේ අවශ්‍යතාවයි.<br><br>වෙනස සහ විවිධත්වය පිළිබඳ ගැටලු පිළිබඳව යෞවනයන් අතර අවබෝධය ප්‍රවර්ධනය කිරීම ඔස්සේ එහි අරමුණු තවදුරටත් විස්තාරණය කරනු ලබයි; ශ්‍රී ලංකික සමාජයේ විවිධ ඉතිහාසයන් හා සම්ප්‍රදායන්; සියලුදෙනා අන්තර්කරණය වීමේ සහ ඉවසීමේ විශ්වීය අගයන්; අධ්‍යාත්මික හා සදාචාරාත්මක වටිනාකම්වලට ගරු කිරීම; අවිහිංසාවාදී සංස්කෘතියක් සහ අන්තර් පුද්ගල හා අන්තර් ප්‍රජාවන් අතර ගැටුම් සාමකාමීව විසඳීම ආදී වශයෙන් වූ තත්ත්වයන් එමගින් වැඩිදුරටත් පෙන්වා දේ.<br><br>ජාතික තරුණ ප්‍රතිපත්තියේ 6 වන පරිච්ඡේදය යටතේ වන මූලික උපායමාර්ග යන් සහ ප්‍රතිපත්තිමය මැදිහත්වීම් මගින් සාමය හා සංහිඳියාව සඳහා වන සැලසුම් පුළුල්ව ඉදිරිපත් කෙරේ. අධ්‍යාපන ආයතනවල විෂය බාහිර ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්තිමය මැදිහත්වීම්වල අවශ්‍යතාව එමගින් අවධාරණය කරනු ලබන අතර; විෂය බාහිර ක්‍රියාකාරකම්, | කලා, ක්‍රීඩා, සංස්කෘතික හා නවෝත්පාදන යන අංශවල තරුණ තරුණියන්ගේ කුසලතා ඵලදායී ලෙස භාවිත කිරීම සඳහා සහ ඒවාට ප්‍රමුඛතාව ලබා දීම සඳහා තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය විසින් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හා අදාළ අනුබද්ධ ආයතන සමඟ එක්ව සහයෝගයෙන් කටයුතු කළ යුතුය.<br><br>ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීම සහ ප්‍රතිසන්ධානය වර්ධනය කිරීම සඳහා ඵලදායී අන්තර් වාර්ගික සම්බන්ධතා, අන්තර් ආගමික සබඳකම් හා අන්තර් සංස්කෘතික හුවමාරු ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සඳහා ශක්තිමත් හා ප්‍රමාණවත් සම්පත්දායකත්වයකින් යුත් ආයතනික සැකසුමකින් තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය විසින් දිගුකාලීන උපායමාර්ග සකස් කළ යුතුය.<br><br>ජාතික තරුණ ප්‍රතිපත්තියේ යෝජිත හා එකඟ වූ ප්‍රතිපත්ති යෝජනාවල ක්‍රියාවලීන් හා කාර්යසාධනය තක්සේරු කිරීම හා ඇගයීම සඳහා තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ස්වාධීන කමිටුවක් පත් කළ යුතුය. ඒ අනුව, නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් යටිතල පහසුකම් සහ නම් කරන ලද නිලධාරීන්ගේ වගවීම ඇතුළත් අධීක්ෂණ හා ඇගයීම් යාන්ත්‍රණයක් සැලසුම් කිරීමට පියවර ගත යුතු වේ.<br><br>ජනවාර්ගික හා ආගම් කේන්ද්‍රීය ආන්තික මතවාදයන්ගෙන් ජනිත වූ දේශපාලන හා | තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය මූලික වගකීම දරයි.<br><br>බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, ජනමාධ්‍ය අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ අනෙකුත් සියලුම රාජ්‍ය ආයතන.<br><br>සිවිල් සමාජය සහ ආධාර සපයන ආයතන විසින් සියලුදෙනාගේ අන්තර්කරණයෙන් යුත් වැඩසටහන් සහ ප්‍රතිපත්තිමය මැදිහත්වීම් සඳහා වැඩි ආයෝජනයක් කළ යුතුය. රටේ තරුණ සාමූහිකයට ක්‍රියාකාරී හා අර්ථවත් සහභාගීත්වයකට, නියෝජනයකට, තීරණ ගැනීමේ අවස්ථාවන් සඳහා එක හා සමානව ප්‍රවේශ වීමේ හැකියාවකට අවැසි ඉඩ ප්‍රස්ථාව ලැබෙන පරිදි ස්වකීය වැඩසටහන් සැලසුම් කළ යුතු වේ. ඊට අමතරව, ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහ ක්‍රියාත්මක කරන්නන්ට තරුණයින් ඇතුළත් පාලන ප්‍රවේශයේ අත්‍යවශ්‍යබව ඒත්තු ගැන්වීම සඳහා සිවිල් සමාජයෙහි උද්දේශන ක්‍රියාකාරකම් අඛණ්ඩව කරගෙන යා යුතුය. |

| | | | |
|---|---|---|---|
| නොමැතිකම ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීමට සැලකිය යුතු බාධකයකි. | ක්‍රීඩා කටයුතු සහ නිර්මාණශීලිත්වය වැඩි දියුණු කිරීමේ අවස්ථා වැනි විනෝදාත්මක අවස්ථා හඳුනාගෙන ප්‍රවර්ධනය කිරීම; විවිධ කලා හා සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා ආයතන පිහිටුවීම; සහ පාසල්වල අනිවාර්ය බාහිර ක්‍රියාකාරකම් ප්‍රාදේශීය සහ කලාප මට්ටමින් ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාව ඉස්මතු කරනු ලැබේ. | සමාජ කතිකාවන්ගෙන් තරුණයින් බැහැර කොට ඔවුන් ඉතිහාසය හා සංස්කෘතිය බෙදාහදා ගැනීමේ පණිවිඩකරුවන් ලෙස සැලකිය යුතු අතර, විවිධ ප්‍රජාවන් අවිශ්වාසය හා අපැහැදිලිභාවය පිළිබඳ නිදන්ගත ප්‍රශ්නය මුලිනුපුටා දැමීම සඳහා ජාතික මට්ටමේ උපායමාර්ගයක් හා ක්‍රියාකාරී සැලැස්මක් තිබිය යුතුය. | |
| **මූලික අවධානය: සමාජ ඒකාබද්ධතාව සහ සංහිඳියාව සම්බන්ධයෙන් වන ආයතනික රාමුව** | | | |
| ප්‍රචණ්ඩ අන්තවාදය යළි ඉස්මතු වීමට ජනවාර්ගිකත්වය හා ආගම කේන්ද්‍ර කරගත් මතවාද හරහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. ජනතාව සහ තරුණ ප්‍රජාව මුහුණ දෙන අවධානය යොමු කළ යුතු සමාජ කරුණු, ප්‍රශ්න සහ අභියෝග සම්බන්ධයෙන් සවන් දීමට සව් විසඳුම් ලබා ගැනීම සඳහා සුදුසු වේදිකාවක් හෝ ව්‍යුහයක් මෙන්ම ඉඩ ප්‍රස්තාවක් ද නොමැතිවම තාරුණ්‍යය සැලකිය යුතු ලෙස ඒ දෙසට තල්ලු වී ඇත.<br><br>ප්‍රජාවන් සහ පවත්නා ආයතනික ව්‍යුහයන් අතර ඇති සැලකිය යුතු මට්ටමේ විශ්වාස පිළිබඳ පරතරය ප්‍රජාවන් අතර බැහැර කිරීමේ හා බෙදීමේ හැඟීම තවදුරටත් වැඩි කරයි. ප්‍රචණ්ඩ අන්තවාදයට පොළඹවාලන කරුණු හා ඒ වෙත ප්‍රජාවන් ආකර්ෂණය කර ගැනීමේ සාධක සමඟ එක්ව ගත් කල ප්‍රචණ්ඩ අන්තවාදයෙහි මූලයන් හා අනෙකුත් හේතු සාධක විසඳීමට | වර්ෂ 2015.12.18 දිනැති අංක 1945/41 ගැසට් පත්‍රය සහ ජාතික ප්‍රතිසන්ධානය පිළිබඳ කටයුතු ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය යටතේ ජාතික සංහිඳියා කාර්යංශයට (ධඟඹසෘ) භාර දී තිබුණි. කෙසේ වෙතත්, වර්ෂ 2020 අගෝස්තු 09 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව, ජාතික සංහිඳියා කාර්යංශය අධිකරණ අමාත්‍යාංශයේ විෂය පථයට පත් කෙරුණි.<br><br>මෙම ආයතනික ව්‍යුහය ස්ථාපිත කරන ලද්දේ "විවිධ ප්‍රජාවන් අතර පවතින ආතතිය හා ගැටුම්වලට හේතු වන ගැටලු නිරාකරණය කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම සහ එවැනි ක්‍රියාමාර්ග අනුගමනය කිරීම හා පසු විපරම් කිරීම" සහ "සියලු ජන කොටස් අතර සාමය හා සමගිය ඇති කිරීම සහ රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම හා පසු විපරම් කිරීම | රට තුළ දැනට පවත්නා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ විවාදය සහ කතිකාව හරහා ස්වාධීන 'ජාතික සංහිඳියා කොමිසමක්' පිහිටුවීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කළ යුතුය. සමාජ සහජීවනය, සමාජ ඒකාබද්ධතාව සහ ප්‍රචණ්ඩ අන්තවාදයේ සිදුවීම් ඇතුළුව ඒවාට පමණක් සීමා නොවී ප්‍රතිසන්ධාන කටයුතු සම්බන්ධ දුක්ගැනවිලි ලබා ගැනීමට එවැනි ස්වාධීන කොමිසමට බලය තිබිය යුතුය. අදාළ යෝජිත කොමිෂන් සභාව මගින් එවැනි කරුණු පිළිබඳව විමසා සුදුසු පරිදි පිළියම් සැපයිය යුතුය. ප්‍රචණ්ඩ අන්තවාදයෙන් ආරක්ෂා වීමට බහු සංස්කෘතික සමාජයේ හා ප්‍රජාවන්ගේ යහපත් පාලනය සඳහා එවැනි ක්‍රියාමාර්ග අත්‍යවශ්‍ය වේ.<br><br>එවැනි ස්වාධීන කොමිසමකට ඵලදායී, කාර්යක්ෂම හා අර්ථවත් ක්‍රියාකාරීත්වයට පහසුකම් සපයන බලාත්මක කළ හැකි | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ කොටසක් වශයෙන් එවැනි ස්වාධීන ආයතනයක් පිහිටුවීමට අවශ්‍ය පියවර රජය විසින් ගත යුතුය.<br><br>ප්‍රචණ්ඩ අන්තවාදයේ ප්‍රතිවිපාක සහ එමගින් උද්ගත වන නැවත යථා තත්ත්වයට පත් කළ නොහැකි සමාජ, ආර්ථික හා දේශපාලන ක්ෂේත්‍රයන්හි පිරිවැය නිදසුන් සහිතව පෙන්වීමට සිවිල් සමාජය කටයුතු කළ යුතු අතර එමගින් විසඳුම් සපයන දිගුකාලීන ස්වාධීන ආයතනික ව්‍යුහයක් සඳහා උද්දේශන කටයුතු අඛණ්ඩව සිදු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| දේශපාලනීකරණය නොවූ ආයතනික ව්‍යුහයක ආරක්ෂණය නොමැතිකම ජාතික සහජීවනය හා සමගිය සඳහා සැලකිය යුතු බාධකයකි. | මෙන්ම දැනුවත්භාවය ගොඩනංවන ප්‍රතිසන්ධාන ක්‍රියාවලියක් සහතික කිරීම සඳහා වැඩසටහන් සම්පාදනය කිරීම" යන අරමුණු සඳහා ය. | බලතල සහිත ආයතනික ශක්තිමත්භාවයක් ලබා දිය යුතුය. | |
| **මූලික අවධානය: ප්‍රධාන ධාරාවේ මාධ්‍ය සහ සමාජමාධ්‍ය** | | | |
| තොරතුරු සංසරණය ඉතා වේගයෙන් සිදුවන පසුබිමක ප්‍රධාන ධාරාවේ මාධ්‍ය සහ විශේෂයෙන් සමාජමාධ්‍යවල වගකීම් විරහිත වාර්තාකරණය සහ සදාචාර විරෝධී හැසිරීම, වැරදි තොරතුරු සමාජගත කිරීම හරහා ක්ෂණිකව ප්‍රචණ්ඩ අන්තවාදී තත්ත්වයන් නිර්මාණය කිරීම සඳහා අන්තවාදී ජනවාර්ගික හෝ ආගමික මතවාද පෙරදැරි කරගෙන කටයුතු කිරීම ගැටලුවකි.<br>මැතිවරණ කාලවලදී ජනමාධ්‍ය පුළුල් ලෙස හා කිසිදු නියාමනයකට යටත් නොවී භාවිත කිරීම ඔස්සේ ජනවාර්ගික හා ආගම් කේන්ද්‍රීය මතවාද හරහා අනිවාර්යයෙන්ම ජනතාවගේ හැඟීම් ගැටුම්කාරී දිශානතීන් වෙත යොමු කරනු ලබයි.<br>සමාජමාධ්‍ය යනු නියාමනය කිරීමට තරම් නොහැකි අන්දමේ පුළුල් හා අභියෝගාත්මක ක්ෂේත්‍රයක් වුවද, විශේෂයෙන් මැතිවරණ කාලවලදී, දේශපාලන න්‍යායපත්‍ර සඳහා විවිධ ජනවාර්ගික හා ආගමික පසුබිම්වල ප්‍රජාවන්ගේ සංවේදීතාවන් අවුළුවන | වර්ෂ 1973 අංක 5 දරන ජාතික රාජ්‍ය සභාවේ ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල නීතිය (වර්ෂ 1973 පෙබරවාරි 27).<br>ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 162/5 ඒ දරන 1981 ඔක්තෝබර් 14 බදාදා දිනැති ගැසට් පත්‍රය.<br>ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව විසින් විවිධ ගැසට් නිවේදන නිකුත් කර ඇති අතර එමඟින් මැතිවරණ කාලවලදී මාධ්‍ය භාවිතයන් නියාමනය කිරීමට උත්සාහ කර ඇත. ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව විසින් එවැනි නියාමනයක් 104 (5) (අ) ව්‍යවස්ථාව යටතේ සිදු කර ඇති අතර එය දේශපාලන පක්ෂ සහ අපේක්ෂකයින් අවම ආචාරධර්ම ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීම සහතික කිරීම සඳහා වන අතර එමඟින් ජාතික සමගියට අගතියක් වන වෛරී කථනය පිළිබඳ යම් නියාමන උත්සාහයක් දරා ඇත. | ප්‍රචණ්ඩ අන්තවාදය ඇති වීමේ තත්ත්වයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් වගකීම් විරහිත මාධ්‍ය හැසිරීම්වල බලපෑම සහ ජාතික සමගිය කෙරෙහි එහි ප්‍රතිවිපාක සමාලෝචනය කිරීමට අදාළ බලධාරීන් විසින් කටයුතු කළ යුතුය. තවද, ජනමාධ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය සමඟ එක්ව අදාළ පාර්ශ්වයන් සමඟ සහයෝගයෙන් කටයුතු කළ යුතු අතර 'ජාතික මාධ්‍ය ප්‍රතිපත්තියක්' සම්පාදනය කිරීමට සැලසුම් කළ යුතුය.<br>වර්තමානයේ ඉස්මතු වෙමින් පවතින සමාජ-දේශපාලන ප්‍රවණතාවන්ට අනුකූලව ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල නීතිය ක්‍රියාත්මක කිරීමේ ඵලදායීතාව ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් සමාලෝචනයට ලක් කළ යුතුය.<br>තවද, ශ්‍රී ලංකාවේ පුවත්පත් මණ්ඩලයේ බලතල "ස්වාධීන මාධ්‍ය කොමිෂන් සභාවක්" දක්වා පුළුල් කිරීමට අදාළ බලධාරීන් විසින් පියවර ගත යුතු අතර, ශ්‍රී ලංකාවේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ වගකිවයුතු මාධ්‍ය සංස්කෘතියක් සහතික කිරීම සඳහා වන බලතල හා | ජනමාධ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය, ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව සහ අදාළ අනෙකුත් රාජ්‍ය ආයතන.<br>වගකීම් විරහිත මාධ්‍ය භාවිතයන්වල සමාජ-දේශපාලනික හා ආර්ථික හානිය, ප්‍රචණ්ඩ අන්තවාදයට ඇති බලපෑම සහ සමාජ සහජීවනය සහ සාමය කෙරෙහි එමඟින් උද්ගත කෙරෙන ප්‍රතිවිපාකයන් සනාථ කරන සාක්ෂි පදනම් කරගත් දත්ත සහ තොරතුරු සොයා ගැනීම සඳහා පර්යේෂණ වැඩසටහන් දියත් කිරීමේ වගකීම සිවිල් සමාජයට ඇත. බහු සංස්කෘතික සමාජයක පැවැත්ම සහ ප්‍රතිසංස්කරණ සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ ක්‍රියාත්මක කරන්නන්ට බලපෑම් කිරීමේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යා යුතුය. |

| | | | |
|---|---|---|---|
| අයුරින් ප්‍රචණ්ඩ අන්තවාදී හැඟීම් ව්‍යාප්ත කිරීම සඳහා එය භාවිත කිරීම තවමත් නොවිසඳුණු ගැටලුවක්ව පවතී. | | බලාත්මක කළ හැකි බලතල එවන් වූ ස්වාධීන කොමිෂන් සභාවකට ලබා දිය යුතුය.<br><br>සමාජයේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සඳහා වූ මාධ්‍යයක් වශයෙන් සමාජමාධ්‍යවල වැදගත් භූමිකාව පිළිග ැනීමට ලක් වුවද, පටු දේශපාලන හා වෙනත් න්‍යායපත්‍ර සඳහා විවිධ ජනවාර්ගික හා ආගමික පසුබිම්වල ප්‍රජාවන් අතර ප්‍රචණ්ඩ අන්තවාදී හැඟීම්, වෛරී කථනයන් සහ වෙනත් ආකාරයේ ප්‍රකාශන ප්‍රකාශයට පත් කිරීම නියාමනය කිරීමට අදාළ පියවර බලධාරීන් විසින් ගත යුතුය. | |

# 6. නිගමනය

මිනිසුන් ප්‍රචණ්ඩ අන්තවාදී තත්ත්වයන්ට පත් වීමට හෝ ශ්‍රී ලාංකේය සමාජයෙහි මෙන්ම, ලෝක මට්ටමින් ද අන්තවාදී ප්‍රචණ්ඩත්වය පැවතීමට මූලිකම හේතුව වශයෙන් දැක්විය හැකි කිසිදු නිශ්චිත හේතුවක් නොමැති වුවද, විශ්වවිද්‍යාල මට්ටමින් පැවැත්වූ සම්මුඛ සාකාච්ඡා මාලාවේදී පළ වූ අදහස්වලින් පෙනී ගියේ, යම් අයෙකු අන්තවාදී ප්‍රචණ්ඩක්‍රියා කෙරෙහි පෙළඹවීමට හෝ ආකර්ෂණය කර ගැනීමට බලපෑ හැකි සාධක ගණනාවක් ඇති බවය.

ව්‍යවස්ථාපිත සෙසු මූලික අයිතිවාසිකම් මෙන්ම, සමානාත්මතාවට ඇති අයිතිය, වදහිංසාවලට ලක් නොවීමේ අයිතිය, නිදහස් අදහස් දැරීමට ඇති නිදහස, ආගම් ඇදහීමට සහ භාෂණයට ඇති නිදහස, රැස්වීම් පැවැත්වීමට, අන්‍යයන් ඇසුරු කිරීමට, රැකියාවක් කිරීමට සහ ගමනාගමනයට ඇති නිදහස මගින් සමාජ ඒකාබද්ධතාව, සහජීවනය සහ විවිධත්වය තුළ පවතින සමගියට ඉඩ සලසා දී ඇත. නමුත් එම අයිතිවාසිකම් නිසි පරිදි භුක්ති විඳීමට අවැසි සමාජ පසුබිම ස්ථාපිත කිරීමට සහ එම අයිතීන්වලට නිසි පිළිගැනීම ලබාදීමට අවශ්‍ය පරිසරය ගොඩනැගීමට නිසි ක්‍රියාදාමයක් නොමැති වීම මනුෂ්‍යයන් ප්‍රචණ්ඩ අන්තවාදීන් වීමට පෙළඹවිය හැකි මෙන්ම ඒ සම්බන්ධයෙන් කඩිනම් විසඳුම් ලබා දීමට අපොහොසත් වුවහොත් බිහිසුණු ප්‍රතිවිපාක ඇති කළ හැකි ගැටලු රැසක් පැනනැගීමට ද හේතු වේ. ජනවාර්ගික ජාතිකවාදය සහ ආගමික අන්තවාදය පොදුවේ ජනතාවත්, විශේෂයෙන්ම තරුණ ප්‍රජාවත්, අන්තවාදී ප්‍රචණ්ඩක්‍රියා කෙරෙහි පොළඹවනු ලබයි. බහුවාර්ගික සමාජයක් තුළ සමාජීය ඒකාබද්ධතාව සහ සහජීවනය තහවුරු කිරීමටත්, සමාජීය හා දේශපාලනික වශයෙන් තීරණාත්මක භූමිකාවක් සහ ඒ සම්බන්ධයෙන් වැඩි වගකීම් ප්‍රමාණයක් දරන්නන් වන දේශපාලඥයන්, දේශපාලන ක්‍රියාකාරීන්, ආගමික නායකයන්, ජනප්‍රිය පුද්ගලයන් තුළ මේ පිළිබඳ සංවේදීතාව වර්ධනය කිරීමත් අන්තවාදී ප්‍රචණ්ඩක්‍රියා සමාජයෙන් මුලිනුපුටා දැමීමේ දී අනිවාර්ය වේ.

ශ්‍රී ලංකාව වැනි බහු සංස්කෘතික සමාජයක් ඇති රටක විවිධත්වයට, සමාජ ඒකාබද්ධතාවට සහ සහජීවනයට තැන දෙමින්, සමාජ දේශපාලනික සංස්කෘතියක් කරා දිගුකාලීනව තරුණ පරපුර යොමු කෙරෙන දිගුකාලීන චර්යාත්මක වෙනසක් සඳහා දරන ඵලදායී ප්‍රයත්නයක් ලෙස, සමස්තයක් වශයෙන් අධ්‍යාපන පද්ධතියට අදාළ උපායමාර්ගික සැලසුම්, අසාර්ථක වූ අවස්ථා, අභියෝග සහ වෙනස් විය යුතු තැන් සම්බන්ධයෙන් විශේෂයෙන් නැවත සලකා බැලීමක් සිදු කළ යුතුය.

නූතන ඩිජිටල් යුගයේ දැවැන්ත සමාජ සංස්කෘතික පෙරළි රැසක් මධ්‍යයේ සාම්ප්‍රදායික සමාජ සබඳතා සහ මානව අන්තර් සබඳතා බිඳ වැටුණු සන්දර්භයකදී, ප්‍රධාන පෙළේ ජනමාධ්‍ය සහ සමාජ මාධ්‍ය තීරණාත්මක භූමිකාවක් ඉටු කරනු ලබයි. එබැවින්, දුර්මත සහ වැරදි තොරතුරු ප්‍රචාරය කරමින් අන්තවාදී ප්‍රචණ්ඩක්‍රියා කෙරෙහි ජනතාව පෙළඹීමට ජනමාධ්‍යයට ඇති ඉඩ ප්‍රස්තාව අහුරමින් මානව සබඳතා අඛණ්ඩව පවත්වා ගැනීමට හැකි වන පරිදි නව උපායමාර්ගික සංකල්ප ඇති කිරීම, සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. ප්‍රචණ්ඩ අන්තවාදයට තුඩුදෙන ආකාරයේ තොරතුරු මාධ්‍යයෙන් බෙදාහැරීම වළක්වාලීමත්, වඩාත් පුළුල් ප්‍රේක්ෂක පිරිසක් ඉලක්ක කරගත්, විවිධ ජාතික සහ ආගමික අනන්‍යතාවන් හිමි පිරිස්වලට සහභාගී වීමටත්, සමාජ, සංස්කෘතික සහ දේශපාලනික ගැටලු සම්බන්ධයෙන්

හරවත් සංවාද පැවැත්වීමටත් සමාන අවස්ථාව ලබාදීම අරමුණු කරගත්, සියලුම මාධ්‍යයන් කෙරෙහි බලපැවැත්වෙන පොදු ආචාරධර්ම පද්ධතියක් පිහිටුවීම කෙරෙහි අවධානය යොමු විය යුතුය. මැතිවරණ කාලසීමාවන් තුළදී වෛරී ප්‍රකාශ සමාජගත කිරීම පොදුවේ සියලුම මාධ්‍යයන් සහ විශේෂයෙන්ම සමාජ මාධ්‍ය අසීමාන්තිකව සහ අධීක්ෂණයකින් තොරව භාවිත කිරීම ප්‍රචණ්ඩ අන්තවාදී තත්වයන් ඇති කිරීමට පෙළඹවීමක් වන නිසා, එය වැළැක්වීමට වහා පියවර ගැනීමේ අවිවාදිත වගකීම අවබෝධ කරගත යුතුය.

දහතුන්වන සහ දහසය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන මගින් දක්වා ඇති පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සිව්වන පරිච්ඡේදයෙන් තහවුරු කර ඇති සිංහල සහ දෙමළ භාෂා ද්විත්වයම  ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂා බවට දී ඇති පිළිග ැනීම ප්‍රායෝගිත තලයේ දී ක්‍රියාවෙන්ම තහවුරු කිරීම වැදගත්ය.  භාෂා ප්‍රශ්නය, එම නිසා සම අවස්ථා නොලැබී යෑම, පුද්ගලයෙකුගේ මුල් භාෂාව පදනම් කොටගෙන සිදු වන නොයෙකුත් අගතීන් මධ්‍යයේ, සිංහල සහ දෙමළ යන භාෂා ද්විත්වයටම රාජ්‍ය සහ පරිපාලනමය භාෂා ලෙස ව්‍යවස්ථාව මගින් පිළිගැනීමක් ලබාදීමට මූලික වූ පාදක හේතු සහ එහි අරමුණු ක්‍රියාවට නැංවීමේ අවශ්‍යතාවය, විවිධ ජනවාර්ගික සහ ආගමික කණ්ඩායම් එකමුතුව ජීවත් වන, අවිහිංසාවෙන් හිංසනය පිටුදකින සමාජ ඒකාබද්ධතාවයෙන් සහ සහජීවනයේ යුතු සමාජයක් බිහිකිරීමේ දී ප්‍රමුඛස්ථානයක් ගනී.

අන්තවාදී ප්‍රචණ්ඩක්‍රියා වැළැක්වීමට නම්, නෛතික, ප්‍රතිපත්තිමය, පරිපාලනමය, ආකල්පමය සහ චර්යාත්මක වෙනස්කම් සහ සිවිල් සහ දේශපාලන අයිතීන්, නිදහස, සමාජ- ආර්ථික සහ දේශපාලන අයිතීන් පිළිබඳ ගැටලුවලට විසඳුම් සපයන අතරම, ජනවාර්ගිකත්වය සහ ආගමික අන්තවාදය මත පදනම්ව පොදු සමාජය සහ විශේෂයෙන්ම තරුණ පරපුර අතර විවිධ ජනවර්ග කෙරෙහි එල්ල වූ සැකය මුලිනුපුටා දැමීම උදෙසා පැහැදිලි දේශපාලන දැක්මක් බිහිකිරීම අත්‍යාවශ්‍ය වන බව මෙකී සාකච්ඡා මාලාවෙහි හරය වූ බව අවසන් වශයෙන් සඳහන් කළ යුතුය.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම සම්බන්ධයෙන් ඔබට අවශ්‍ය ඕනෑම තොරතුරක් පිළිබඳව සහය වීමට අප සූදානම්!

ක්‍ෂණික ඇමතුම්

## තොරතුරු සහය මධ්‍යස්ථානය

**011-30 30 463**

(සතියේ දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 5.00 දක්වා)




தகவல் அறியும் உரிமை பற்றி உங்களுக்குத் தேவையான அனைத்து தகவல்கள் தொடர்பாகவும் ஒத்துழைப்பு வழங்குவதற்கு நாங்கள் தயார் !

உடனடித் தொடர்புகளுக்கு

## தகவலுக்கான உதவிப் பணியகம்

**011-30 30 463**

(வாரநாட்களில் மு.ப. 9.00 மணி தொடக்கம் பி.ப. 5.00 மணி வரை)

CPA
Centre for Policy Alternatives

ISBN : 978-624-5914-06-7